ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රමීය

# බුද්ධ වන්දනා ක්‍රමය

ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථා

**සංස්කරණය**

## අතිපූජනීය නාඋයනේ අරියධම්ම ස්වාමීන් වහන්සේ

**ධර්ම දානය**

නාඋයන ආරණ්‍ය සේනාසනස්ථ
ශ්‍රී සම්බුද්ධ ශාසනානුග්‍රහ සමිතිය සහ
ආරණ්‍යස්ථ සිල් පිරිස

# ප්‍රාර්ථනා

ඉමිනා අධිකාරෙන - කතෙන සුද්ධ චෙතසා
කල්‍යාණාරාම මහා ථෙරො - පාපුණාතු සිවං පදං

ඉමිනා අධිකාරෙන - කතෙන සුද්ධ චෙතසා
ජිනවංස මහා ථෙරො - පාපුණාතු සිවං පදං

ධම්මෙන නෙන මතිසිද්ධ මුදාචිත්තේන
බුද්ධාදි වත්ථු ගත ධම්ම බලේන සද්ධිං
ථෙරා සභො අරියධම්ම යතින්ද නාථො
දීඝායුකො භවතු සාධු සමිද්ධ චිත්තො

# ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රමීය

# බුද්ධ වන්දනා ක්‍රමය

*සම්පාදනය*

අතිපූජ්‍ය ත්‍රිපිටකාචාර්ය
**නාඋයනේ අරියධම්ම ස්වාමීන් වහන්සේ**

*ධර්ම දානය*

**නාඋයන ආරණ්‍ය සේනාසනස්ථ ශ්‍රී සම්බුද්ධ ශාසනානුග්‍රහ සමිතිය සහ ආරණ්‍යස්ථ සිල් පිරිස**

*ප්‍රාර්ථනය*

අතිපූජ්‍ය ත්‍රිපිටකාචාර්ය නාඋයනේ අරියධම්ම ස්වාමීන් වහන්සේට සහ පූජනීය අඟුල්ගමුවේ අරියනන්ද ස්වාමීන් වහන්සේට දීර්ඝායු සම්පත්තිය පැතීම සහ සිල් පිරිසගේ පරලොව සැපත් සියළු ඥාතීන්ට නිවන් සැප පැතීම

# වචනයක් ....

ආලෝකය හා අන්ධකාරය යන ස්වභාව තත්ව දෙකක් ලොව පවත්නේය. මෙයින් ආලෝකය කාටත් එකසේ හිත වැඩ සලසන ප්‍රර්ථනීය තත්වය වන නමුත් අඳුරට ප්‍රිය කරන අඳුරෙන් වැඩ ගන්නා පිරිසකුත් ලොව ඇති සැටි නිසා කට යුත්තේය. ඒ චෞරාදීහුයි. සොරා එළියට අප්‍රියකරන නිසා එළියෙන් ඔහුට වැඩක් නැති නිසා ඔහුගේ නිරන්තර වෑයම එළිය නිවා ගැනීමටය.

ධර්ම අධර්ම දෙකේ තත්වයත් මෙබඳුයි. එළියත් අඳුරත් දෙක එකට එක් නොවන්නාක් මෙන් ධර්මයත් අධර්මයත් කවර කලෙකවත් එක්වන්නේ නැත. අධර්ම බලවේගයට වාසි වැඩිවීවාක් මෙන් පෙනෙන්නේ අධර්ම පෙළපාලියට එක් වන නිශ්‍රය තත්ත්වය අධික නිසාය. පත්තුවන පහනට හැම පැත්තෙන්ම සුළං වැනි විරෝධී බලවේග අවුත් එය නිවා දැමීමට ගැටෙනු පෙනෙන්නේ ආලෝකයේ විපක්‍ෂය වූ අන්ධකාරයට සහායවන ගතියෙනි.

මේ විධියට අධර්මයටත් අනුබල වැඩියි. මාර නමින් කියවෙන ඒ අධර්ම සහායක සේනාවෝ නොයෙක් වෙසින් නොයෙක් ලෙසින් ධර්මය තළා පෙළා නසා වනසා ලීමට රොද බැඳ එන්නාහු වෙති.

ධර්මාරාක්‍ෂක කඳවුරු වන්නේ උදාර පුද්ගල සන්තානයයි. ඒ ශ්‍රේෂ්ඨ පුද්ගල නමැති කඳවුරු ඇතුළේ ජීවමාන වන ධර්මය අපරිමාණ අධර්මවේග මැඩගෙන ආලෝකය පතුරුවමින් අපරාජිතව බබලන්නේය. ධර්මයේ රක්‍ෂාස්ථානය වූ ධර්මයේ ආධාරකය වූ මහා පුරුෂ සන්තානය කුමන හේතුවකින් හෝ අබල දුබල වීම නිසා අභාවයට යාම නිසා ධර්මය නිරාධාර වන්නේය. නිරාලම්බ වන්නේය. ධර්මය අතුරුදහන් වී අධර්ම අන්ධකාරයෙන් ලෝකය වැසීයන්නේ එහෙයිනි.

ඔබත්, අපත්, මේ පේලිවී පෙළ ගැසෙන්නේ ධර්මයේ ආරක්‍ෂක කඳවුරු බටව පත්වෙනු සඳහාය. ධර්මයේ ප්‍රබල කඳවුරු වීම අපේ ප්‍රාර්ථනයයි. ඔබත් ඒ ධර්ම කඳවුරු පංතියේ බව සිහි කරන්න. ධර්මය උදෙසා පේවී ආත්ම ජීවිත නිරපෙක්‍ෂකව ඒ මහා ධර්මවීර උතුමන් නොපැකිල ගමන් කළ ධර්ම විජයේ ශාන්ති මාර්ගයට අපිත් අනුයාත වී සිටිමු. අධර්ම මාර ප්‍රලය සහස්‍ර ගුණයෙන් නැගී ඒවා.

**"ධුනාථ මච්චුනො සෙනං - නළාගාරංව කුඤ්ජරො"**

මහා හස්ති රාජයකු බටකොළ ගෙයක් පොඩිකර සිඳබිඳ දමන්නාක් මෙන් මර සෙනග මැඩ පලවා හරිව් යන බුද්ධාඥාවෙන් උත්තේජිතව පරාක්‍රම ගුණයෙන් සැදී අපි ඉදිරියට ගමන් කරමු. ධර්මාරක්‍ෂාව සඳහා මෙතෙක් ප්‍රගුණ කළ ආත්ම මහිමයේ

තරම පළඹිය යුත්තේ හිරිහැර පීඩා නැමැති මාර උවදුරු පියමං කරගෙන ඉදිරියට යන ප්‍රතිශ්‍රොතගාමී තත්ත්වයෙනි.

**ධම්මකාමො භවංහොති - ධම්ම දෙස්සී පරාභවො**

ධර්මකාමියා දිනයි. වැඩෙයි. ධර්මද්වේෂියා පරදියි. යන බුද්ධ භාෂිතයද සිහිකළ මැනවි.

කිසිම ආමිස ලාභ අපේක්ෂාවක් නොමැතිව පවිත්‍ර වූ ධර්ම ප්‍රාර්ථනාවෙන්, ශාසනය රැක ගැනීමේ මහා අධිෂ්ඨානයෙන් යුතුව සමාරබ්ධ වූ ශ්‍රී කල්‍යාණී යොගාශ්‍රම සංස්ථාව ගමන් මග නිවමින් සනසමින් නොනැවතී ගලායන ගංගා ප්‍රවාහයක් මෙන් පුරා අවුරුදු අටසාලිස් වසක් පැවැත් වූ උදාර ශාසන මෙහෙවර සැලකිය යුත්තේ හොඳහිතේ ප්‍රාතිහාර්‍යයක් වශයෙනි.

මෙම උතුම් යෝගාශ්‍රමීය ශාසනික වැඩ පිළිවෙල පටන් ගෙන 1999 ජුනි 18 වෙනිදාට වර්ෂ අටසාලිසක් පිරෙයි. අපි අවුරුදු අටසාලිසක් සසුන් ගමනක යෙදුනෙමු. බුදුරජාණන් වහන්සේ අපට වදාළ ශාසන මෙහෙවර එක එල්ලේම සිදුවන ලෙසට ආමිසගරුක නොව ප්‍රතිපත්තියට මුල්තැන දෙමින් අප මේ අටසාලිස් වසරක් තුළ විසිතුරු කළ සසුන් පෙරහැර දෙස ආපසු බැලිය යුත්තේ ආධ්‍යාත්මිකව වැඩී ඇති ධර්ම අස්වැන්න ආත්ම ප්‍රත්‍යවෙක්ෂණ වශයෙන් දැක සැනසී ගැන්මට ඉදිකොට ගත් පරම භාග්‍ය අවස්ථාවක් විලසිනි. මැණික් වැලකට එක්වන මැණික, මැණිකෙන් මැණික අවස්ථාවක් විලසිනි. මැණික් වැල බබුළුවන්නාක් මෙන් අපේ මේ සසුන් ගමනට පේලිවූ මේ සසුන් පෙරහැර විසිතුරු කල අපේ සත්පුරුෂ මණ්ඩලය සැබවින්ම මට දැනෙන්නේ අගනා මිණිරුවන් එකතුවක් ලෙසිනි.

ධර්මයෙන් වෙළීගෙන ක්ෂාන්ති මෛත්‍රී ගුණයෙන් පැහැ ගැන්වීගෙන අපි අවුරුදු අටසාලිසක් ධර්ම ගමනක එක් වී ගමන් කළෙමු. අපේ මේ එකතුව යාව නිබ්බාන වේවා !

**සතං සමාගමො හොතු - යාව නිබ්බාන පත්තියා**

මෙයට - ධර්මයෙන් සැනසෙන
**කඩවැද්දුවේ ජිනවංස ස්ථවිර**

ගුණවර්ධන යොගාශ්‍රම මධ්‍යස්ථානය
ගල්දුව, කහව.
2543/1999 06. 18

# පෙරවදන

බුද්ධානුස්සති භාවනාවක් වැඩෙන සේ ශ්‍රී කල්‍යාණි යෝගාශ්‍රමීය බුද්ධ වන්දනා ක්‍රමය නමැති මෙම පොත සකස් වූයේ මෙයට අඩසිය වසරකට පෙර අතිගරු පූජනීය ප්‍රධානාචාර්ය රාජකීය පණ්ඩිත මාතර සිරි ඤාණාරාමාභිධාන මහෝපාද්‍යාය මාහිමිපාණන් වහන්සේ අතිනි. මෙම වන්දනා ක්‍රමය ශ්‍රී කල්‍යාණි යෝගාශ්‍රම සංස්ථාවට අයත් සැම සේනාසනයකම දවසට තුන් වේලක් එකම කාලසටහනකට අනුව පැවැත්වෙන බව ඉතා සතුටින් සඳහන් කරනුයේ බුද්ධ ශාසන ප්‍රතිපත්ති සුරක්ෂිත වීම පිණිස ඉන් සැලසෙන ධර්ම ශක්තිය අතිවිශාල බැවිනි. ඉකුත් වූ අඩසිය වසර තුළ බොහෝ වාරයක් මුද්‍රණය කරවූ මේ වන්දනා ක්‍රමය මෙවර මුද්‍රණය කරවා බෙදා දෙනුයේ නාඋයන ආරණ්‍යස්ථ ශ්‍රී සම්බුද්ධ ශාසනානුග්‍රහ සමිතිය සහ ආරණ්‍යස්ථ සිල් පිරිසගේ දායකත්වයෙනි.

මින් ජනිත වන පුණ්‍ය සම්භාරය මේ වන්දනා ක්‍රමයේ නිර්මාතෘ වන අපවත් වී වදාළ අතිගරු පූජනීය රාජකීය පණ්ඩිත මාතර සිරි ඤාණාරාමාභිධාන මහෝපාධ්‍යාය මාහිමිපාණන් වහන්සේට අමාමහ නිවන් සුව පිණිසම හේතුවේවා. අපවත් වී වදාළ ශ්‍රී කල්‍යාණි යෝගාශ්‍රම සංස්ථාවේ සමුත්පාදක ප්‍රධාන අනුශාසක අතිගරු පූජනීය රාජකීය පණ්ඩිත කඩවැද්දුවේ ශ්‍රී ජිනවංසාභිධාන අස්මදාචාර්ය මාහිමිපාණන් වහන්සේ මතු උතුම් ලොව්තුරා බුදු බවට පත්වේවා.

ශ්‍රී කල්‍යාණි යෝගාශ්‍රමීය බුද්ධ වන්දනා ක්‍රමය යෝගාශ්‍රමීය සියළුම මහා සංඝරත්නය විසින් ඉතාමත් ගෞරවයෙන් එකලෙස භාවිතා කෙරේ. තදනුගාමික දස දහස් ගණන් බොදු උවසු උවැසියෝද එසේම එය අනුගමනය කරති. එහෙයින් මෙය ගෞතම සම්බුද්ධ ශාසන ප්‍රතිපත්ති මාර්ගයේ ආරක්ෂාව අභිවර්ධනය පිණිසම හේතුවේවා.

මෙම ධර්ම දානමය පුණ්‍යලාභය හිමිකර ගත් නාඋයන ආරණ්‍යස්ථ සිල් පිරිසේ සැමටත් නාඋයන ආරණ්‍යස්ථ ශ්‍රී සම්බුද්ධ ශාසනානුග්‍රහ සංගමයේ සැමටත් ධර්මඥාන භාවනාඥානයත් ආයුරාරෝග්‍යාදි ශ්‍රී සම්පත්තියත් අභිවර්ධනය වේවා.

ඒ සැම දෙනා වෙනුවෙන් පරලෝ සැපත් සියලු ඥාති හිත මිත්‍රාදීන්ටත් සුගති සම්පත් සමග අමාමහ නිවන් සුවයත් අත්වේවා. මෙය ඉතාමත් ශෝභන ලෙස මුද්‍රණය කරදුන් අම්බලන්ගොඩ සක්වා ප්‍රින්ටර්ස් ආයතනාධිපතිතුමන් ප්‍රධාන කාර්ය මණ්ඩලයටත් දෙලොව සුබ සෙතත් ශාන්ත නිවන් සුවයත් සාක්ෂාත් වේවා.

සුඛිනෝවා ඛේමිනෝ හොන්තු - සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා

මෙයට
මෙතැති
**නාළයනේ අරියධම්ම ස්ථවිර**

නාළයන ආරණ්‍ය සේනාසනය,
පන්සියගම.
2553/2009

# පුණ්‍යානුමෝදනය

"බුද්ධොපි බුද්ධස්ස භණෙය්‍ය වණ්ණං
කප්පං' පි චෙ අඤ්ඤං' මහාසමානො
ඛීයෙථ කප්පො චිර දීඝ' මන්තරෙ
වණ්ණො න ඛීයෙථ තථාගතසස"

යනුවෙන් සඳහන් වන උතුම් බණ පදය පූජනීය නාඋයන ලොකු ස්වාමීන් වහන්සේගෙන් අප නොයෙක් වර අසා ඇත්තෙමු.

බුදුරජාණන් වහන්සේ නමක් මුළු කල්පයක් තිස්සේම වෙන කිසිවක් දේශනා නොකොට තවත් බුදුරජාණන් වහන්සේ නමකගේ ගුණ පමණක් දේශනා කළත් බොහෝ කාලයකට පසු කල්පය ගෙවී අවසන් වෙයි. එසේ නමුත් බුදුගුණ දේශනාව, බුදුගුණ වර්ණනාව අවසන් නොවේ.

මෙලෙස එම ගාථා ධර්මයේ අදහස පැහැදිලි කරමින් පූජනීය ස්වාමීන් වහන්සේ බුද්ධගුණ සහ බුදුගුණ මෙනෙහි කිරීමේ ආනිසංසත් නොයෙක් වර අපට කියා දී ඇත. ඒ උතුම් කල්‍යාණ මිත්‍රයාණන් වහන්සේගේ අවවාද අනුශාසනා පරිද්දෙන් කටයුතු කරන අපට අදහස් වුයේ බුද්ධ, ධම්ම, සංඝ යන ත්‍රිවිධ රත්නයටම පූජාවන ආකාරයේ මහඟු පිංකමක් කිරීමටයි. කලින් නොයෙක් වර මුද්‍රණයට ගෙන ඇති, නොයෙක් ආකාරයේ බුද්ධ ගුණ, බුද්ධ කදාණ එලෙසම ධර්ම ගුණ, සංඝ ගුණ මේ ආදි උතුම් ගුණ ස්කන්ධයන් කැටි කොට සකසා ඇති "ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ භාවිතා වන වන්දනා පොත" නැවත වරක් මුද්‍රණය කොට බෙදා හැරීම අගනා කටයුත්තක් බවයි. මෙම මහඟු බුද්ධ පූජාව සිදුකරනුයේ අප සිල් පිරිසේ සියළු දෙනාත්, නාඋයන ආරණ්‍යස්ථ සම්බුද්ධ ශාසනානුග්‍රහ සමිතියේ සියළු දෙනාත් යන අප සැමගේම එකතුවෙනි.

මෙලෙස අප සියළු දෙනා විසින් මෙම උතුම් ග්‍රන්ථය මුද්‍රණය කිරීමේ කුසල ශක්තියෙනුත්, නොයෙක් ආකාරයෙන් පුරණය කරන ලද සීල, සමාධි ආදි ගුණ ධර්මවල ශක්තියෙනුත් නොයෙක් ආකාරයේ ශාසනික පිංකම්වලට සහ සම්බන්ධ වීමෙන් රැස්කරගත් කුසල ශක්තියෙනුත් අපට උතුම්ම, උතුම් කල්‍යාණ මිත්‍රයන් වහන්සේ නමක් වන අතිගෞරවණීය නාඋයනේ අරියධම්ම ස්වාමීන් වහන්සේ බොහෝ කලක් නිදුක් වේවා ! නිරෝගී වේවා ! සුවපත් වේවා ! තව තවත් අපටත්, නොයෙක් දෙස් විදෙස් ජනතාවටත් උදව් උපකාර කිරීමට ශක්තියත්,

ධෛර්යයත්, දීඝායුෂත් අභිවර්ධනය වේවා. අප මේ කරගත් පුණ්‍ය සම්භාරය ද පූජනීය ස්වාමීන් වහන්සේගේ පාරමී ගමනට එක්වීමෙන් සියළු ලෝකවාසී සත්වයනටම පිහිටවන්නට ශක්තියක්ම වේවා ! ගෞරවනීය ස්වාමීන් වහන්සේ මතු උතුම් ලොව්තුරා බුද්ධත්වයම ලබත්වා !

එසේම අප මේ කරගත් පුණ්‍ය සම්භාරය මෙම ග්‍රන්ථයේ නිර්මාතෘ වන අපවත් වී වදාළ පූජනීය මාතර ශ්‍රී ඤාණාරාම ස්වාමීන් වහන්සේටත් අපවත් වී වදාළ අතිපූජනීය කඩවැද්දුව ශ්‍රී ජිනවංස ස්වාමීන් වහන්සේටත් එසේම නාඋයන සේනාසනයේ නිර්මාතෘ පූජනීය වීගොඩ බෝධිරක්ඛිත ස්වාමීන් වහන්සේටත් මතු උතුම් ලොව්තුරා බුද්ධත්වය පිණිසම හේතුවේවා !

එසේම අපට නොයෙක් ආකාරයෙන් අවවාද අනුශාසනා ලබාදෙන පූජනීය අගුල්ගමුවේ අරියනන්ද ස්වාමීන් වහන්සේත් මේ කුසල ශක්තියෙන් බොහෝ කාලයක් නිදුක් වේවා ! නිරෝගී වේවා ! සුවපත් වේවා ! ස්වාමීන් වහන්සේට ද මේ පින නිවන් පිණිසම හේතු වේවා !

එලෙසම නාඋයන සෙනසුනේ වැඩ වසන සියළුම ස්වාමීන් වහන්සේලාට මේ කුසලය අමාමහ නිවන් අවබෝධය පිණිසම හේතු වේවා.

එමෙන්ම මෙම පොත මුද්‍රණයට නොයෙක් ආකාරයෙන් උදව් උපකාර කළ නාඋයන ආරණ්‍යස්ථ සම්බුද්ධ ශාසනානුග්‍රහ සමිතියේ සැමටත්, අප සිල් පිරිසේ සැමටත් මෙම කුසලය නිවන් පිණිසම හේතුවේවා ! අප නමින් මිය පරලොව ගිය සියළු ඤාතීන්ටත්, සියළු දෙවියන්ටත් මේ පින දුකින් මිදීම පිණිසම වේවා !

එසේම මෙම මා හැඟි ග්‍රන්ථය මුද්‍රණය කරවා දීමට කටයුතු කළ සක්වා ප්‍රින්ටර්ස් අධිපතිතුමා ඇතුළු සියළු කාර්ය මණ්ඩලය ද මේ පින් බෙලෙන් සැම කල්හි නිදුක් වේවා ! නීරෝගී වේවා ! සුවපත් වේවා ! ව්‍යාපාර කටයුතු තව තවත් සාර්ථක වෙත්වා ! සියළු දෙනාට නිවන් අවබෝධය පිණිසමත් හේතු වේවා !

සියළු සත්වයෝ සුවපත් වේවා !!!

මෙයට,
ශාසනාලය ඇති,
**නාඋයන ආරණ්‍ය සේනාසනස්ථ ශ්‍රී සම්බුද්ධ**
**ශාසනානුග්‍රහ සමිතිය සහ ආරණ්‍යස්ථ සිල් පිරිස**

# ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රමීය

# වන්දනා ක්‍රමය

## අළුයම වන්දනාව

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස**

ඒ භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදු රජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා !

### ආරාධනාව

**යාවතා භගවා ලොකෙ - තිට්ඨෙය්‍ය තව සාසනං**
**තාවතා පතිගණ්හාතු - පූජා ලොකානුකම්පයා**

භාග්‍යවතුන් වහන්ස ! යම්තාක් ඔබ ශාසනය ලොවැ පවතී නම්, ඒතාක් ලෝකානුකම්පාවෙන් සියලු පූජාවන් පිළිගන්නා සේක්වා !

### පහන් පූජාව

**ගන්ධතෙලප්ප දිත්තේන - දීපෙන තම ධංසිනා**
**තිලොක දීපං සම්බුද්ධං - පූජයාමි තමොනුදං**

සුවඳ තෙලින් දල්වූ, අඳුර දුරලන්නා වූ මේ පහතින් තුන් ලොවට පහනක් වූ, මෝහාන්ධකාරය දුරැලූ බුදුරජාණන් වහන්සේ පුදමි. සාධු ! සාධු ! සාධු !

### සුවඳ පූජාව

**සුගන්ධිකාය වදනං - අනන්ත ගුණ ගන්ධිනං**
**සුගන්ධිනාහං ගන්ධෙන - පූජයාමි තථාගතං**

සුවඳවත් කයක් හා ශ්‍රී මුඛයක්ද ඇති අනන්ත වූ ගුණ සුවඳින් සුවඳවත් වූ තථාගත බුදුරජාණන් වහන්සේ මෙම සුවඳින් පූජා කරමි. පූජා වේවා !

## පැන් පූජාව

**සුගන්ධං සීතලං කප්පං - පසන්න මධුරං සුභං**
**පාණීය මෙතං භගවා - පතිගණ්හාතු මුත්තම**

උතුම් භාග්‍යවතුන් වහන්ස ! සුවඳින් සුවඳවත් වූ ද සිහිල් වූ ද කැප වූද, පහන්, මිහිරි, පිවිතුරු මේ පැන් පිළිගනන්නා සේක්වා !

සාධු ! සාධු ! සාධු !

## (කැඳ තේ) ගිලන්පස පූජාව

**අධිවාසෙතු නො භන්තෙ (තරලං) පණීතං ඛීර පානකං**
**අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තම**

ස්වාමීනි ! අපගේ ආරාධනාව ඉවසන සේක්වා ! අප විසින් සකස් කළ මේ ප්‍රණීත ක්ෂීරපානය අනුකම්පාවෙන් පිළිගන්නා සේක්වා !

## මල් පූජාව

**වණ්ණ ගන්ධ ගුණොපෙතං - එතං කුසුම සන්තතිං**
**පූජයාමි මුනින්දස්ස - සිරිපාද සරොරුහෙ**

මනා වර්ණයන් හා සුගන්ධයෙන් යුත් මේ මල් සමූහයෙන් මුනීන්ද්‍රයන් වහන්සේගේ ශ්‍රී පාද පද්මයෙහි පූජා කරමි.

**පූජෙමි බුද්ධං කුසුමෙන නෙන**
**පුඤ්ඤෙදන මෙතෙන ලභාමි මොක්ඛං**
**පුප්ඵං මිලායාති යථා ඉදං මෙ**
**කායො තථායාති විනාස භාවං**

මම මේ මලින් බුදුරජාණන් වහන්සේ පුදන්නෙමි. මේ පිනෙන් නිවන් ලබම්වා ! මේ මල මැලවෙන්නාසේ මාගේ සිරුරද විනාශයට පත්වන්නේය.

## බුද්ධ වන්දනාව

**ඉතිපි සො භගවා අරහං සම්මා සම්බුද්ධො විජ්ජාචරණ සම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්ම සාරථි සත්ථා දේව මනුස්සානං බුද්ධො භගවති.**

**බුද්ධං ජීවිත පරියන්තං සරණං ගච්ඡාමි යෙච බුද්ධා අතීතාච යෙච බුද්ධා අනාගතා - පච්චුප්පන්නාච යෙ බුද්ධා අහං වන්දාමි සබ්බදා, නත්ථි මේ සරණං අඤ්ඤං බුද්ධො මෙ සරණං වරං - එතෙන සච්ච වජ්ජේන හොතු මෙ ජයමංගලං, උත්තමංගෙන වනේදහං පාදපංසු වරුත්තමං - බුද්ධෙ යො ඛලිතො දොසො බුද්ධො ඛමතු තං මමං.**

★ බුද්ධ රත්නය දිවි හිමියෙන් සරණ යමි.

★ අතීත බුද්ධ රත්නයද, අනාගත බුද්ධ රත්නයද වර්තමාන ගෞතම බුද්ධ රත්නයද මම සැම කල්හිම නමස්කාර කරමි. නමස්කාර වේවා!

★ බුද්ධ රත්නය හැර මට අන් සරණක් නැත්තේ ය. බුද්ධ රත්නය මාගේ උතුම් සරණය වන්නේ ය. ඒ සත්‍යානුභාවයෙන් මට ජය මංගල්‍යයක් වේවා.

★ භාග්‍යවතුන් වහන්සේගේ සිරිපා පහස ලද දූවිල්ල ද මම හිස මුදුනින් වන්දනා කරමි. බුද්ධ රත්නය කෙරෙහි සිදු වූ මාගේ පමා වරදට භාග්‍යවතුන් වහන්සේ ක්ෂමාවන සේක්වා!

සාධු ! සාධු ! සාධු !

## ධර්ම වන්දනාව

**ස්වාක්ඛාතො භගවතා ධම්මො සන්දිට්ඨිකො අකාලිකො ඒහිපස්සිකො ඔපනයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහීති.**

**ධම්මං ජීවිත පරියන්තං සරණං ගච්ඡාමි යෙච ධම්මා අතීතාච යෙච ධම්මා අනාගතා - පච්චුප්පන්නාච යෙ ධම්මා අහං වන්දාමි සබ්බදා,**

**නත්ථි මේ සරණං අඤ්ඤං ධම්මො මෙ සරණං වරං - ඒතෙන සච්ච වජ්ජේන හොතු මෙ ජයමංගලං, උත්තමංගෙන වන්දෙහං ධම්මං ච තිවිධං වරං ධම්මෙ යො කලිතො දොසො ධම්මො ඛමතු තං මමං.**

★ ධර්ම රත්නය දිවි හිමියෙන් සරණ යමි.

★ අතීත ධර්ම රත්නයද, අනාගත ධර්ම රත්නයද, වර්තමාන ධර්ම රත්නයද මම සැම කල්හි නමස්කාර කරමි. නමස්කාර වේවා!

★ ධර්මරත්නය හැර මට අන් සරණක් නැත්තේ ය. ධර්ම රත්නය මාගේ උතුම් සරණය වන්නේ ය. මේ සත්‍යානුභාවයෙන් මට ජය මංගලයක් වේවා.

★ ලොව්තුරු මග-ඵල-නිවන යන ත්‍රිවිධ වූ ධර්ම රත්නයට, මාගේ හිස මුදුනින් නමස්කාර කරමි. නමස්කාර වේවා. ධර්ම රත්නය කෙරෙහි සිදු වූ මාගේ පමා වරදට ධර්ම රත්නය මට ක්ෂමා වන සේක්වා!

සාධු ! සාධු ! සාධු !

## සංඝ වන්දනාව

**සුපටිපන්නො භගවතො සාවක සංඝො, උජුපටිපන්නො භගවතො සාවක සංඝො, ඤායපටිපන්නො භගවතො සාවක සංඝො, සාමීචිපටිපන්නො භගවතො සාවක සංඝො යදිදං චත්තාරි පුරිස යුගානි අට්ඨ පුරිස පුග්ගලා එස භගවතො සාවක සංඝො ආහුනෙය්‍යො පාහුනෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති.**

**සංඝං ජීවිත පරියන්තං සරණං ගච්ඡාමි යෙච සංඝා අතීතාච යෙච සංඝා අනාගතා - පච්චුප්පන්නාච යෙ සංඝා අහං වන්දාමි සබ්බදා, නත්ථි මේ සරණං අඤ්ඤං සංඝො මෙ සරණං වරං - ඒතෙන සච්ච වජ්ජේන හොතු මෙ ජයමංගලං, උත්තමංගෙන වන්දෙහං සංඝංච තිවිධොත්තමං - සංඝෙ යො කලිතො දොසො සංඝො ඛමතු තං මමං.**

★ සංඝ රත්නය මම දිවි හිමියෙන් සරණ යමි.

★ අතීත සංඝ රත්නයද අනාගත සංඝ රත්නයද වර්තමාන සංඝ රත්නයද මම සැම කල්හී නමස්කාර කරමි. නමස්කාර වේවා!

★ සංඝ රත්නය හැර මට අන් සරණක් නැත්තේය. සංඝ රත්නය මාගේ උතුම් සරණය වන්නේ ය. මේ සත්‍යානුභාවයෙන් මට ජය මංගල්‍යක් වේවා!

★ සම්මුති-සේඛ-අසේඛ යන ත්‍රිවිධ උත්තම සංඝ රත්නයට මම උත්තමංගයෙන් නමස්කාර කරමි. නමස්කාර වේවා! මාගෙන් සිදු වූ පමා වරදට සංඝරත්නය මට ක්‍ෂමා වන සේක්වා!

සාධු ! සාධු ! සාධු !

## තෙරුවන් ගුණ මුදුන්පත් කිරීම

**බුද්ධ ධම්මා ච පච්චෙක - බුද්ධ සංඝා ච සාමිකා**
**දාසො වාහස්මි මෙතෙසං ගුණංධාතු සිරෙ සදා**

බුද්ධ, ධර්ම, සංඝ, යන ත්‍රිවිධරත්නය හා පසේ බුදුවරයන් වහන්සේලා මගේ ස්වාමීහු වෙති. මම මෙහෙකරු වැනි යෙමි. උන්වහන්සේලාගේ ගුණය හැමකල්හිම මාගේ සිරසෙහි පිහිටාවා.

**තිසරණං තිලක්ඛණු - පෙක්ඛං නිබ්බානමන්තිමං**
**සුවන්දෙ සිරසා නිච්චං - ලභාමි තිවිධා මහං**

බුද්ධ, ධර්ම, සංඝ යන සරණ තුනද අනිත්‍ය, දුක්ඛ, අනාත්ම, යන ලක්ෂණත්‍රයද, උපේක්ෂාවද, අන්තිම සැපය වූ නිර්වාණයද නිත්‍යයෙන්ම වඳිමි. ඒ පිනෙන් මාර්ග ඵලය නිවන් ලබම්වා !

**තිසරණං ච සිරෙ ඨාතු - සිරෙ ඨාතු තිලක්ඛණං**
**උපෙක්ඛා ච සිරෙ ඨාතු - නිබ්බානං ඨාතු මෙ සිරෙ.**

තිසරණය ද, ත්‍රිලක්ෂණයද, උපේක්ෂාවද, නිර්වාණය ද මගේ මස්තකයෙහි පිහිටාවා.

**බුද්ධෙ සකරුණෙ වන්දෙ - ධම්මෙ පච්චේක සම්බුද්ධෙ**
**සංඝෙ ච සිරසායෙව - තිධා නිච්චං නමාමහං**

මහා කාරුණික බුදුරජාණන් වහන්සේලාද, උන්වහන්සේලා විසින් දේශිත සද්ධර්මයද පසේ බුදුවරයන් හා ශ්‍රාවක සංඝයාද ත්‍රිවිධද්වාරයෙන් නමස්කාර කරමි.

**නමාමි සත්ථුනොවාදප්පමාද වචනන්තිමං**
**සබ්බෙපි චෙතියෙ වන්දෙ - උපජ්ඣාචරියෙ මමං**
**මය්හං පණාමතෙජෙන - චිත්තංපාපෙහි මුච්චතන්ති**

ශාස්තෘන් වහන්සේ වදාළ අප්‍රමාද පදයද සියළු චෛත්‍යයන්ද මාගේ උපාධ්‍යාය ආචාර්යවරයන්ද නමස්කාර කරමි. මේ වන්දනාමය කුසල තේජසින් මාගේ සිත පාපයන් කෙරෙන් මිදේවා.

සාධු ! සාධු ! සාධු !

## චුද්දස බුද්ධ ඤාණ වන්දනාව

1. **දුක්ඛෙ ඤාණං බුද්ධ ඤාණං**
2. **දුක්ඛ සමුදයෙ ඤාණං බුද්ධ ඤාණං**
3. **දුක්ඛ නිරොධෙ ඤාණං බුද්ධ ඤාණං**
4. **දුක්ඛ නිරොධ ගාමිනි පටිපදාය ඤාණං බුද්ධ ඤාණං**
5. **අත්ථ පටිසම්භිදෙ ඤාණං බුද්ධ ඤාණං**
6. **ධම්ම පටිසම්භිදෙ ඤාණං බුද්ධ ඤාණං**
7. **නිරුත්ති පටිසම්භිදෙ ඤාණං බුද්ධ ඤාණං**
8. **පටිභාන පටිසම්භිදෙ ඤාණං බුද්ධ ඤාණං**
9. **ඉන්ද්‍රිය පරොපරියත්තෙ ඤාණං බුද්ධ ඤාණං**

10. සත්තානං ආසයානුසයෙ ඤාණං බුද්ධ ඤාණං
11. යමක පටිහාරියෙ ඤාණං බුද්ධ ඤාණං
12. මහාකරුණා සමාපත්තියා ඤාණං බුද්ධ ඤාණං
13. සබ්බඤ්ඤුත ඤාණං බුද්ධ ඤාණං
14. අනාවරණ ඤාණං බුද්ධ ඤාණං

ඉමානි චුද්දස බුද්ධ ඤාණානි, ඉමෙසං අට්ඨඤාණානි සාවකසාධාරණානි, ඡ ඤාණානි අසාධාරණානි සාවකෙහි, ඉමෙහි චුද්දස බුද්ධඤාණෙහි සමන්නාගතං සම්මා සම්බුද්ධං භගවන්තං සිරසා නමාමි.

සාධු ! සාධු ! සාධු !

# සත්ත සත්තති ඤාණ වත්ථූනි.

## සත් සැත්තෑ ඤාණ

ජාතිපච්චයා ජරාමරණන්ති ඤාණං අසති ජාතියා නත්ථි ජරාමරණන්ති ඤාණං අතීතම්පි අද්ධානං ජාතිපච්චයා ජරා මරණන්ති ඤාණං, අසති ජාතියා නත්ථි ජරාමරණන්ති ඤාණං අනාගතම්පි අද්ධානං ජාති පච්චයා ජරාමරණන්ති ඤාණං, අසති ජාතියා නත්ථි ජරාමරණන්ති ඤාණං, යම්පිස්ස තං ධම්මට්ඨිති ඤාණං තම්පි ඛය ධම්මං වය ධම්මං විරාග ධම්ම නිරොධ ධම්මන්ති ඤාණං

භවපච්චයා ජාතීති ඤාණං, අසති භවස්මිං. නත්ථි ජාතීති ඤාණං -පෙ-

උපාදානා පච්චයා භවොති ඤාණං, අසති උපාදානස්මිං නත්ථි භවොති ඤාණං -පෙ-

තණ්හා පච්චයා උපාදානන්ති ඤාණං අසති තණ්හාය නත්ථි උපාදානන්ති ඤාණං -පෙ-

වෙදනා පච්චයා තණ්හාති ඤාණං, අසති වෙදනාය නත්ථි තණ්හාති ඤාණං -පෙ-

**ඵස්ස පච්චයා වෙදනාති ඤාණං, අසති ඵස්සස්මිං නත්ථි වෙදානති ඤාණං -පෙ-**

**සළායතන පච්චයා ඵස්සොති ඤාණං, අසති සළායතනස්මිං නත්ථි ඵස්සොති ඤාණං -පෙ-**

**නාම රූප පච්චයා සළායතනන්ති ඤාණං, අසති නාම රූපස්මිං නත්ථි සළායතනන්ති ඤාණං -පෙ-**

**විඤ්ඤාන පච්චයා නාමරූපන්ති ඤාණං, අසති විඤ්ඤාණස්මිං නත්ථි නාමරූපන්ති ඤාණං -පෙ-**

**සංඛාර පච්චයා විඤ්ඤාණන්ති ඤාණං, අසති සංඛාරෙසු නත්ථි විඤ්ඤාණන්ති ඤාණං - පෙ -**

**අවිජ්ජා පච්චයා සංඛාරාති ඤාණං, අසති අවිජ්ජාය නත්ථි සංඛාරාති ඤාණං, අතීතම්පි අද්ධානං -පෙ- අනාගතම්පි අද්ධානං අවිජ්ජා පච්චයා සංඛාරාති ඤාණං, අසති අවිජ්ජාය නත්ථි සංඛරාති ඤාණං, යම්පිස්සතං ධම්මට්ඨිති ඤානං තම්පි වය ධම්මං විරාග ධම්මං නිරොධ ධම්මන්ති ඤාණන්ති**

**ඉමානි සත්ත සත්ති ඤාණානි. ඉමෙහි සත්ත සත්තතියා ඤාණෙහි සමන්නාගතං සම්මා සම්බුද්ධං භගවන්තං සිරසා සමාමි.**

සාධු ! සාධු ! සාධු !

**තේරුම**

ඉපදීම ඇති කල්හි ජරා මරණ ඇත්තේ යයි දැනගන්නා ඤාණය, ඉපදීම නැති කල්හි ජරා මරණ නැත්තේ යයි දැනගන්නා ඤාණය. අතීත කාලයෙහිද ඉපදීම නිසා ජරා මරණ ඇතිවී යයි දන්නා නුවණය, ඉපදීම නැති කල්හි ජරාමරණ නැතැයි දන්නා නුවණය. අනාගත කාලයෙහිද, ඉපදීම ඇති කල්හි ජරාමරණ

ඇති වන්නේයයි දැනගන්නා නුවණය. ඉපදීම නැති කල්හි ජරාමරණ නැතැයි දන්නා නුවණය.

යම් ඒ ප්‍රත්‍යයාකාර ඤාණයක් වන්නේ නම් එය ද ක්ෂයවන සුළුය. ව්‍යය ස්වභාව ඇත්තේය. විරාග ස්වභාව ඇත්තේය. නිරෝධ ස්වභාව ඇත්තේ යයි දන්නා නුවණය.

ඉතිරිපද වලට ද මෙසේ සත් ආකාරයකින් නයක්‍රමය යොදා ගත යුතුය.

## වත පිරිත් සජ්ඣායනාව

1. කරණීය මෙත්ත සූත්‍රය

2. උදෙතයං චක්ඛුමා එකරාජා යනාදි මොර පිරිතේ මුල් කොටස

## මෛත්‍රී භාවනාව

**අහං අවෙරො හොමි. අබ්‍යාපජ්ජෙඩා හොමි. අනීඝො හොමි. සුඛී අත්තානං පරිහරාමි.**

**අහං විය මය්හං ආචරියුපජ්ඣායා මාතා පිතරො හිත සත්තා මජ්ඣත්තික සත්තා වෙරී සත්තා අවෙරා හොන්තු අබ්‍යාපජ්ඣා හොන්තු අනීඝා හොන්තු සුඛී අත්තානං පරිහරන්තු, දුක්ඛා මුච්ජන්තු යථාලද්ධ සම්පත්තිතො මාවිගච්ජන්තු කම්මස්සකා.**

**ඉමස්මිං විහාරෙ ඉමස්මිං ගොචර ගාමෙ ඉමස්මිං නගරෙ ඉමස්මිං ලංකාදීපෙ ඉමස්මිං ජම්බුදීපෙ ඉමස්මිං චක්කවාළෙ ඉස්සර ජනා සීමට්ඨක දෙවතා සබ්බෙ සත්තා, අවෙරා හොන්තු අබ්‍යාපජ්ඣා හොන්තු අනීඝා හොන්තු සුඛී අත්තානං පරිහරන්තු දුක්ඛා මුච්චන්තු යථා ලද්ධ සම්පත්තිතො මාවිගච්ජන්තු කම්මස්සකා.**

**පුරත්ථිමාය දිසාය, දක්ඛිණාය දිසාය, පච්ඡිමාය දිසාය, උත්තරාය දිසාය.**

**පුරත්ථිමාය අනුදිසාය, දක්ඛිණාය අනුදිසාය, පච්ඡිමාය අනුදිසාය, උත්තරාය අනුදිසාය, හෙට්ඨිමාය දිසාය, උපරිමාය දිසාය.**

**සබ්බෙ සත්තා සබ්බෙ පාණා සබ්බෙ භූතා, සබ්බෙ පුග්ගලා සබ්බෙ අත්තභාව පරියාපන්නා, සබ්බා ඉත්ථියො, සබ්බෙ පුරිසා, සබ්බෙ අරියා, සබ්බෙ අනරියා, සබ්බෙ දෙවා, සබ්බෙ මනුස්සා, සබ්බෙ විනිපාතිකා අවෙරා හොන්තු අබ්‍යාපජ්ඣා හොන්තු අනීඝා හොන්තු සුඛී අත්තානං පරිහරන්තු, දුක්ඛා මුච්චන්තු යථා ලද්ධ සම්පත්තිතො මාවිගච්ඡන්තු කම්මස්සකා.**

## තේරුම

මම වෛර නොකරමි. තරහ නොවෙමි. නිදුක් වෙමි. නිරෝගී වෙමි. සුවපත් වෙමි.

මා මෙන් මගේ ආචාර්ය උපාධ්‍යාය මව්පිය හිත සත්වයෝ ද මැදහත් සත්වයෝද වෛරී සත්වයෝද වෛර නොවෙත්වා. තරහ නොවෙත්වා, නිදුක් වෙත්වා, නිරෝගී වෙත්වා, සුවපත් වෙත්වා, දුකින් මිදෙත්වා, ලද සැපතින් නොපිරිහෙත්වා, කර්මය ස්වකීය කොට ඇත්තාහ.

මේ විහාරයෙහි ද, මේ ගොදුරු ගමෙහි ද, මේ නුවරෙහි ද, මේ ලක්දිවෙහි ද, මේ සක්වළෙහි ද ඉසුරු ජනයෝ ද සීමස්ථක දෙවියෝ ද, සියලු සත්වයෝ ද වෛර නොවෙත්වා. තරහ නොවෙත්වා. නිදුක් වෙත්වා. නීරෝගි වෙත්වා සුවපත් වෙත්වා. දුකින් මිදෙත්වා. ලද සැපතින් නො පිරිහෙත්වා. කර්මය ස්වකීය කොට ඇත්තාහ.

නැගෙනහිර දිශාවෙහිද, දකුණු දිශාවෙහිද, බටහිර දිශාවෙහිද, උතුරු දිශාවෙහිද, නැගෙනහිර අනු දිශාවෙහිද, දකුණු අනු දිශාවෙහිද, බටහිර අනු දිශාවෙහිද, උතුරු අනු දිශාවෙහිද, යට දිශාවෙහිද, උඩ දිශාවෙහිද, සියලු සත්වයෝද, සියලු ප්‍රාණීහුද, සියලු භූතයෝද, සියලු පුද්ගලයෝද, සියලු ආත්මභාව ඇත්තෝද, සියලු ස්ත්‍රීහුද, සියලු පුරුෂයෝද, සියලු ආර්‍ය්‍යයෝද, සියලු

අනායමීයෝද, සියලු දෙවියෝද, සියලු මනුෂ්‍යයෝද, සියලු අපායික සත්වයෝද වෛර නොවෙත්වා. තරහ නොවෙත්වා, නිදුක් වෙත්වා, නිරෝගී වෙත්වා, සුවපත් වෙත්වා, දුකින් මිදෙත්වා, ලද සැපතින් නොපිරි හෙත්වා. කමර්මය ස්වකීය කොට ඇත්තාහ.

## බුද්ධානුස්සති භාවනාව

1. **බුද්ධානුස්සති මෙත්තාච - අසුභං මරණස්සති**
   **ඉතිඉමා චතුරාරක්ඛා - භික්ඛුභාවෙය්‍ය සීලවා**

සුසිල්වත් යෝගාවචරතෙම බුදුගුණ, මෛත්‍රිය, අසුභය, මරණය යන චතුරාරක්‍ෂක භාවනා වඩන්නේය.

2. **අනන්ත විත්ථාර ගුණං - ගුණතොනුස්සරං මුනිං**
   **භාවෙය්‍ය බුද්ධිමා භික්ඛු - බුද්ධානුස්සති මාදිතො.**

බුද්ධිමත් යෝගාවචරයා චතුරාරක්‍ෂක භාවනා අතුරෙන් පළමුව අනන්ත ගුණ ඇති සම්මා සම්බුදු රජාණන් වහන්සේගේ පතළ ගුණස්කන්ධය භාවනා වඩන්නේය.

3. **සවාසනෙ කිලෙ සෙසො - එකො සබ්බෙනිඝාතිය**
   **අහුසුසුද්ධ සන්තානො - පූජානඤ්ච සදාරහො**

ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ වාසනා සහිතව සකල ක්ලේශයන් නසා අතිශයින් සුද්ධ සන්තාන ඇතියෝය, දෙව් මිනිසුන් විසින් කරනු ලබන අනේක ප්‍රකාර පූජාවන්ට ද සුදුසු වූ සේක.

4. **සබ්බකාලගතෙ ධම්මෙ - සබ්බෙ සම්මා සයං මුනී**
   **සබ්බාකාරෙන බුජ්ඣිත්වා - එකො සබ්බඤ්ඤුතංගතො**

ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ අතීත, අනාගත, වර්තමාන යන සර්ව කාලයන්ට අයත් වූ සියලු ධර්මයන් තමන් වහන්සේ විසින් මනාකොට අවබෝධ කර එකළාව සර්වඥත්වයට පැමිණි සේක.

**5. විපස්සනාදි විජ්ජාහි - සීලා දි චරණෙහිච**
**සුසමිද්දෙහි සම්පන්නො - ගගනාභෙහි නායකො**

ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ අතිශයින් සමෘද්ධවූ ආකාශය බඳුවූ විදර්ශනා ඥානාදී විද්‍යාවන්ගෙන් ද ශීලාදි චරණ ධර්මයන්ගෙන් ද යුක්තවන සේක.

**6. සම්මාගතො සුභංඨානං - අමොඝවචනොච සො**
**තිවිධස්සාපි ලොකස්ස - සදාතානිරවසෙසතො**

ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ පරම සුන්දර නිර්වාණයට මනාකොට වැඩිය සේක. නොහිස් නොවරදින වචන ඇති සේක. ත්‍රිවිධවූම ලෝකය නිරවශේෂයෙන් දන වදාළ සේක.

**7. අනෙකෙහි ගුණොඝෙහි - සබ්බසත්තුත්තමො අහු**
**අනෙකෙහි උපායෙහි - නරදම්මෙ දමෙසිච**

ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ශීලාදී අනේක ගුණෞඝයන් කරණකොට සකල සත්වයන්ටම උත්තම වූ සේක. අනේකකෝපායයෙන් අදම්‍ය පුද්ගලයන් දමනය කළ සේක.

**8. එකො සබ්බස්ස ලොකස්ස - සබ්බ සත්තානුසාසකො**
**භාග්‍ය ඉස්සරියාදීනං - ගුණානං පරමොනිධි**

ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ සකල ලෝකයාට අසහාය ශාස්තෘන් සර්වසත්තානු ශාසකයන් වහන්සේ ද වූ සේක. භාග්‍ය ඓශ්වර්‍ය්‍යාදි ගුණයන්ගේ පරම නිධානය වූ සේක.

**9. පඤ්ඤාස්ස සබ්බ ධම්මෙසු - කරුණා සබ්බ ජන්තුසු**
**අත්තත්ථානං පරත්ථානං - සාධිකා ගුණජෙට්ඨිකා**

ඒ භාග්‍යවතුන් වහන්සේගේ සකල ධර්මයන් කෙරෙහි පවත්නා ප්‍රඥාවද සකල සත්වයන් කෙරෙහි පවත්නා මහා කරුණාවද, ආත්මාර්ථ, පරාර්ථ දෙක සිදුකරන ප්‍රධාන ගුණ දෙකෙකි.

10. **දායාද පාරමී චිත්වා - පසද්සදා යත්තාන මුද්ධරී**
**උද්දරී සබ්බ ධම්මෙච - දයායසද්සෙදව උද්ධරී**

ඒ භාග්‍යවතුන් වහන්සේ සකල සත්වයන් කෙරෙහි පවත්නා මහා කරුණාවෙන් සමතිස් පෙරුම් දහම් සපුරා ප්‍රඥාවෙන් තමන් සසර සයුරෙන් නගාගත් සේක. සකල ධර්ම සමූහයද දැන වදාළ සේක. කරුණාවෙන් අන්‍ය සත්වයන් ද සසර සයුරෙන් ගොඩ නැගූ සේක.

11. **දිස්සමානොපි තාවස්ස - රූපකායො අචින්තියො**
**අසාධාරණ සදාණඩ්ඩේ - ධම්මකායෙ කථාවකාති**

ඇසට නොපෙන්නාවූද ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ රූපකයද අචින්ත්‍යයය. අසාධාරණ ඥාණයන්ගෙන් පොහොසත් වූ උන්වහන්සේගේ ධර්මකාය ගැන කවර කථාද? එය අචින්ත්‍යමය.

## මෛත්‍රී භාවනාව

1. **අත්තූපමාය සබ්බෙසං - සත්තානං සුඛකාමතං**
**පස්සිත්වා කමතොමෙත්තං - සබ්බ සත්තෙසු භාවයෙ**

තමා සැපයට කැමැත්තා සේම අන් සියලු සත්වයෝ සැපයට කැමතියයි තමා නිදසුනෙහි තබා සියළු සත්වයන් කෙරෙහි මෛත්‍රිය වැඩිය යුතුය.

2. **සුඛී භවෙය්‍යං නිද්දුක්ඛො - අහං නිච්චං අහං විය**
**හිතාච මෙ සුඛී හොන්තු - මජ්ඣත්තා එව වෙරිනො**

මම නිරන්තරයෙන් සැප ඇත්තේ වෙම්වා, දුක් නැත්තේ වෙම්වා, මා මෙන් මා හට හිත සත්වයෝද මධ්‍යස්ථයෝ ද වෛරීහුද සැමකල්හි සුවපත් වෙත්වා.

3. **ඉමම්හිගාමක්ඛෙත්තම්හි - සත්තා හොන්තු සුඛී සදා**
**තතො පරඤ්ච රජ්ජෙසු - චක්කවාළෙසු ජන්තුනො**

මේ ගමෙහි සකල සත්වයෝ සැම කල්හි සුවපත් වෙත්වා. එයින් ඔබ රාජ්‍යවල සක්වළවල සත්වයෝද සැම කල්හි සුවපත් වෙත්වා.

4. **සමන්තා චක්ක වාළෙසු - සත්තානන්තෙසු පාණිනො**
**සුඛිනො පුග්ගලාභූතා - අත්තභාව ගතා සියුං**

මේ සක්වළ හාත්පස අනන්ත චක්‍රවාටයන්හි සියලු සත්වයෝ සකල ප්‍රාණීහු සකල පුද්ගලයෝ සකල භූතයෝ සකල ආත්මභාව පර්‍යාපන්නයෝ සුවපත් වෙත්වා.

5. **තථා ඉත්ථී පුමාචෙව - අරියා අනරියා පිච**
**දෙවා නරා අපායට්ඨා - තථා දස දිසාසුචාති.**

එසේම සියලු ස්ත්‍රීහුද, පුරුෂයෝද, ආර්‍යයෝද, අනාර්‍යයෝද, දෙවියෝද, මනුෂ්‍යයෝද, අපායිකයෝද, සුවපත් වෙත්වා. දශ දිශාවෙහි සකල සත්වයෝද සුවපත් වෙත්වා.

## අශුභ භාවනාව

1. **අවිඤ්ඤාණා සු භනිභං - සවිඤ්ඤාණා සුභං ඉමං**
**කායං අසුභතො පස්සං - අසුභං භාවයෙ සතිං**

විඥානය පහවූ මළ සිරුර යම් සෙද එසේ යෝගාවචරයා විසින් සවිඥානක අසුභවූ මේ කය පිළිකුල් වශයෙන් බලමින් අසුභානුස්මෘති භාවනාව වැඩිය යුතුය.

2. **වණ්ණ සණ්ඨාන ගන්ධෙහි - ආසයො කාසතො තථා**
**පටික්කුලානි කායෙමෙ - කුණපානි ද්වි සොළස**

මාගේ ශරීරයෙහි ඇති මේ කේශාදී කුණප දෙතිස පැහැයෙන්ද සටහනින්ද, ගන්ධයෙන්ද ආශ්‍රයස්ථානයෙන් ද පිහිටි අවකාශයෙන්ද ප්‍රතික්කූලයෝය.

**3. පතිතම්හාපි කුණපා - ජෙගුච්ජං කාය නිස්සිතං**
**ආධාරොහි සුචීතස්ස - කායෙතු කුණපෙඨිතං**

ශරීරයෙන් වෙන්ව වැටුනාවූ කුණපයටද වඩා කයෙහි පවත්නා කුණපය පිළිකුල්ය. කුමක් හෙයින් ද යත්? වැටුනා වූ කුණපයාගේ ආධාරය (පවත්නා තැන) පිරිසිදුය. කයෙහි සිටි කුණපය වනාහි කුණපයෙහිම පිහිටියේය. එහෙයිනි.

**4. මීල්හෙකිම්ව කායොයං - අසුචිම්හි සමුට්ඨිතො**
**අන්තො අසුචි සම්පුණ්ණො - පුණ්ණ වච්චකුටි විය**

මේ කය අසූචියෙහි උපදනා පණුවකු මෙන් අසූචියෙහිම හටගත් දෙයකි. පිරුණු වැසිකිළියක් සෙයින් ඇතුළද අසූචියෙන් පිරී ඇත්තේය.

**5. අසුචි සන්දතෙ නිච්චං - යථාමෙදකථාලිකා**
**නානා කිමිකුලාවාසො - පක්කචන්දනිකා විය**

සිදුරු ඇති අමු මස් සැලියකින් මෙන් මේ ශරීරයෙන් නිරන්තරයෙන් මලමූත්‍රාදී අසූචි ගලන්නේය. මේ ශරීරය පල්වූ ගවරවළක් සෙයින් නා නා කෘමීන්ගේ වාසස්ථානයකි.

**6. ගණ්ඩභූතො රොගභූතො - වණභූතො සමුස්සයො**
**අතෙකිච්ඡා'ති ජෙගුච්ජො - පභින්න කුණපූපමොති**

මේ ශරීරය ගෙඩියක් වැනිය. රෝගයක් වැනිය. වණයක් වැනිය. පිළියම් කිරීමට දුෂ්කර වූවකි. ඉතා පිළිකුලක, තැනින් තැන බිඳුණු කුණපයක් වැනිය.

# මරණානුස්සති භාවනාව

1. **පවාතදීප තුල්‍යාය - සායුසන්තතියාක්ඛයං**
**පරූපමාය සම්පස්සං - භාවයෙ මරණස්සතිං.**

මහත් වූ සුළඟට අසු වූ පහන නිවීයන්නා සේ ආයුෂ පරම්පරාවෙන් ගෙවීයාම සිහිකරමින් (මරණයට පත්) අන්‍යයන් උපමා කොට මරණානුස්මෘති භාවනාව වැඩිය යුතුය.

2. **මහා සම්පත්ති සම්පත්තා - යථා සත්තා මතා ඉධ**
**තථා අහං මරිස්සාමි - මරණං මම හෙස්සති**

මහා සම්පත්තියට පැමිණියා වූ සත්වයෝ යම් සේ මළාහුද එපරිද්දෙන් මමද මැරෙමි. මට මරණය වන්නේය.

3. **උප්පතියා සහෙවෙදං - මරණං ආගතං සදා**
**මාරණත්ථාය ඔකාසං - වධකො විය එසති**

මේ මරණය උත්පත්තිය සමග ආ එකෙක. මාරයා සැම කල්හිම මැරීම පිණිස අවකාශයක් වධකයෙකු මෙන් සොයන්නේය.

4. **ඊසකං අනිවත්තන්තං - සතතං ගමනුස්සුකං**
**ජීවිතං උදයා අත්ථං - සුරියො විය ධාවති**

සැම කල්හි ගමනට උත්සාහ කරන ඇසිල්ලකුදු නො නවතින (ජීවිතය) උදාවීමෙහි සිට අස්තයට යන හිරුමෙන් ඉපදීමේ පටන් මරණය කරා දුවන්නේය.

5. **විජ්ජු බුබ්බුලඋස්සාව - ජලරාජී පරික්ඛයං**
**ඝාතකොව රිපූතස්ස - සබ්බත්ථාපි අවාරියො**

විදුලියක් මෙන් දිය බුබුලක් මෙන් පිණි බිඳක් මෙන් දියහෙි ඇඳි ඉරක් මෙන් මේ ජීවිතය වහා ක්ෂ වන්නේය. මේ මරණය කවරාකාරයකින්වත් වැළැක්විය නොහෙන මරන්නට එන සතුරෙකු වැනිය.

6. **සුයත්ථාම පුඤ්ඤිද්ධි - බුද්ධි වුද්ධි ජිනංචයං**
**ඝාතෙසි මරණං ඛිප්පං - කාතුමාදිසකෙ කථා**

මහත් වූ යසසින්ද, බලයෙන්ද, පිනෙන්ද, නුවණින් ද වැඩුනාවූ මේ ලොව්තුරා බුදුරජාණන් වහන්සේ ද මාරයා වහා නැසුවේය. මා වැනියන් මැරීම ගැන කවර කථාද?

7. **පච්චයානඤ්ච වෙකල්‍යා - බාහිරජ්ඣත්තුපද්දවා**
**මරාමොරං නිමෙසාපි - මරමානො අනුක්ඛණන්ති.**

ක්ෂණයක් පාසා සිදුවන නාමරූප බිඳීම නිසා ක්ෂණයක් පාසා මැරෙන්නාවූ මම ජීවත්වීමට වුවමනා ප්‍රත්‍යන් නොලැබී යාමෙන් ද බාහ්‍යාභ්‍යන්තරික උපද්‍රවයකින් ඇසිපිය හෙළීමකට ද කෙටි කලදී මැරෙමි.

**භාවෙත්වා චතුරා රක්ඛා - ආවජ්ජෙය්‍ය අනන්තරං**
**මහා සංවෙග වත්ථූනි - අට්ඨ අට්ඨිත වීරියො**

**ජාති ජරා ව්‍යාධි චුති අපායා**
**අතීත අප්පත්තක වට්ටදුක්ඛං**
**ඉදානි ආහාර ගවෙට්ඨි දුක්ඛං**
**සංවෙග වත්ථූනි ඉමානි අට්ඨ**

ඉපදීම දිරීම ව්‍යාධිය මරණය හා අපාය දුක්ඛය ද අතීත සංසාර දුකද අනාගත සංසාර දුකද දැනට ආහාර සැපයීමේ දුකද යන මේවා සංවේග වස්තු අට නම් වෙති.

**පාතොච සායමපි චෙච ඉමං විධිඤ්ඤු**
**ආසේවතෙ සතත මත්ත හිතාභිලාසී**
**පප්පොති සොති විපුලං හතපාරිපන්ථො**
**සෙට්ඨං සුඛං මුනිවිසිට්ඨමතං සුඛෙනචාති.**

තමහට හිතවැඩ කැමැත්තෙක් උදය සවස මේ බුද්ධානුස්සති ආදි චතුරාරක්ෂක භාවනා විධිය නිතිපතා වඩන්නේ ද හෙතෙම මාරක බාධක සියල්ල ජයගෙන මුනීන්ද්‍රයන් වහන්සේ වදාළා වූ විපුල වූ ශ්‍රේෂ්ඨ වූ අමාමහ නිවනට සුවසේ පැමිණේ.

# අනේකවිධ පුණ්‍යානුමෝදනා හා ප්‍රාර්ථනා ගාථා

1. **ඉමිනා පුඤ්ඤකම්මේන - උපජ්ඣායා ගුණුත්තරා**
**ආචරියූපකාරාච - මාතා පිතා පියා මමං**

මේ කුශලානුභාව බලයෙන් මාගේ ආචාර්ය උපාධ්‍යාය ගුණෝත්තම උතුමෝද, උපකාරකයෝද, ප්‍රිය මවුපිය දෙගුරුන්ද,

2. **සුරියො චන්දිමාරාජා - ගුණවන්තානරාපිච**
**බ්‍රහ්මා මාරාච ඉන්දාච - ලොකපාලාච දෙවතා**

චන්ද්‍ර සූර්ය රාජයෝද, ගුණවත් මනුෂ්‍යයෝද, බ්‍රහ්මයෝ ද, මාරයෝද, ඉන්ද්‍රයෝද, ලෝක පාලක දෙවියෝද,

3. **යමො මිත්තා මනුස්සාච - මජ්ඣත්තාවෙරිකාපිච**
**සබ්බේ සත්තා සුඛීහොන්තු - පුඤ්ඤානි පකතානිමෙ**

යම දෙව් රජු ද, මිත්‍ර මනුෂ්‍යයෝද, මධ්‍යස්ථයෝද, වෛරීහුද, සියළු සත්වයෝද සුවපත් වෙත්වා.

4. **සුඛං ච තිවිධං දෙන්තු - ඛිප්පං පාපෙථ වොමතං**
**ඉමිනා පුඤ්ඤ කම්මෙන - ඉමිනා උද්දිසෙනච**

මවිසින් විශේෂයෙන් රැස්කරන ලද කුශලයෝ ත්‍රිවිධ සම්පත් දෙත්වා. හවත්හු වහා නිවනට පමුණුවනු ලබත්වා.

5. **ඛිප්පා හන්තුලභෙචෙව - තණ්හුපාදාන ඡෙදනං**
**යෙ සන්තානෙ හීනාධම්මා - යාව නිබ්බානතො මමං**

මේ කුශලයෙන්ද මේ උදෙසීමෙන් ද මම තෘෂ්ණා උපාදානයක් සිඳීම වහා ලබම්වා.

6. **නස්සන්තු සබ්බදායෙව - යත්ථ ජාතො භවෙ භවෙ**
**උජු චිත්තො සතිපඤ්ඤො - සල්ලෙඛො විරිය වාමිනා**

නිවන දක්වා මගේ සන්තානයේ පාප ධර්ම නොපිහිටේවා. උපනුපන් භවයක් පාසා සැම කල්හි සෘජු සිත් ඇත්තේ සෘති ප්‍රඥා ඇත්තේ, සල්ලේඛ ප්‍රතිපදා ඇත්තේ, වීර්යය ඇත්තේද වෙම්වා!

**7. මාරාලභන්තු නොකාසං - කාතුං ච විරියෙතු මෙ**
**බුද්ධො දීපවරො නාථො - ධම්මො නාථො වරුත්තමො**

**8. නාථො පච්චෙක සම්බුද්ධො - සංඝො නාථොත්තරො මමං**
**තෙසොත්තමානු භාවෙන - මාරොකාසං ලභන්තු මා.**

මේ කුශලයෙන් මාරයෝ අවකාශ නොලබත්වා. මා හට වීර්යය කිරීම පිණිස බුද්ධරත්නය උතුම් පිහිටය. ධර්ම රත්නය ද මට උතුම් පිහිටය. ප්‍රත්‍යෙක බුද්ධ රත්නය ද ආර්ය මහා සංඝරත්නය ද මා හට උතුම් පිහිටය. ඒ උත්තම රත්නත්‍රයානුභාවයෙන් මාරයෝ අවකාශ නොලබත්වා.

**භවග්ගුපාදාය අවීචි හෙට්ඨතො**
**එත්ථන්තරෙ සත්ත කායුපපන්නා**
**රූපී අරූපීච අසඤ්ඤි සඤ්ඤිනො**
**දුක්ඛා පමුච්චන්තු ඵුසන්තු නිබ්බුතිං**

භවාග්‍රයෙහි පටන් අවීචිය දක්වා මේ අතර සත්ව ලෝකයට ඇතුළත් වූ රූපී අරූපී සඤ්ඤී අසඤ්ඤී සියලු සත්වයෝ දුකෙන් මිදෙත්වා. නිවන් සුව ලබත්වා.

**දෙවො වස්සතු කාලෙන - සස්ස සම්පත්ති හොතුච**
**පීතො භවතු ලොකොච - රාජා භවතු ධම්මිකො.**

කලට වැසි වසීවා. ගොවිතැන් දියුණු වේවා. රට සශ්‍රීක වේවා. රජ දැහැමි වේවා.

## සුගතො වාදය

1. **අප්පමාදෙන භික්ඛවෙ සම්පාදෙථ**
**දුල්ලභො බුද්ධුප්පාදො ලොකස්මිං**
**දුල්ලභො මනුස්සත්ත පටිලාභො**
**දුල්ලභා ඛණ සම්පත්ති**
**දුල්ලභා පබ්බජ්ජා**
**දුල්ලභං සද්ධම්ම සවණං**
**දුල්ලභො සප්පුරිස සංසෙවො**

මහණෙනි ! බුදු සසුන ලොව දුර්ලභය. මිනිසත් බව දුර්ලභය. ඉන්ද්‍රිය පරිපූර්ණ ක්‍ෂණ සම්පත්තිය දුර්ලභය. ශාසන ප්‍රව්‍රජ්‍යාව දුර්ලභය. නෛර්යාණික සද්ධර්මශ්‍රවණය දුර්ලභය. සත් පුරුෂ ආශ්‍රය දුර්ලභය. එසේ හෙයින් නොපමාව සිහි නුවණින් පිළිවෙත් සපුරමි.

2. **ආරභථ නික්ඛමථ - යුඤ්ජථ බුද්ධ සාසනෙ**
**ධුනාථ මච්චුනොසෙනං - නළාගාරං ව කුඤ්ජරො**

මේ බුදු සසුනේ පිළිවෙත් පිරීමෙහි ආරම්භ ධාතු වීර්යය කරමි. නික්ඛමධාතු වීර්යය ද කරමි. පරාක්‍රමධාතු වීර්යයෙන් යෙදෙමි. යම්සේද? මහා හස්තිරාජයෙකු බටකොළ ගෙයක් සිඳ බිඳ දමන්නාක් මෙනි. මර සෙනග පලවාහරිමි.

3. **යො ඉමස්මිං ධම්ම විනයෙ - අප්පමත්තො විහෙස්සති**
**පහාය ජාති සංසාරං - දුක්ඛස්සන්තං කරිස්සති**

යම් නුවණැත්තෙක් මේ බුදු සස්නෙහි නොපමාව වීර්යය කෙරේ නම් ජාති සංසාරය හැරදමා දුක් කෙළවර කොට නිවන් දකින්නේය.

# පටිච්චසමුප්පාද ධර්මය

*අනුලෝමය*

අවිජ්ජා පච්චයා සංඛාරා, සංඛාරා පච්චයා විඤ්ඤාණං විඤ්ඤාණ පච්චයා නාමරූපං, නාමරූප පච්චයා සළායතනං, සළායතන පච්චයා ඵස්සො, ඵස්ස පච්චයා වෙදනා, වෙදනා පච්චයා තණ්හා, තණ්හා පච්චයා උපාදානං,

උපාදාන පච්චයා භවො, භව පච්චයා ජාති, ජාති පච්චයා ජරා මරණං, සොක පරිදෙව දුක්ඛ දොමනස්සුපායාසා සම්භවන්ති ඒවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති.

*පටිලෝම වාරය*

අවිජ්ජායත්වෙව අසෙස විරාග නිරොධා සංඛාර නිරොධො සංඛාර නිරොධා විඤ්ඤාණ නිරොධො, විඤ්ඤාණ නිරොධා, නාමරූප නිරොධො, නාමරූප නිරොධා සළායතන නිරොධා, සළායතන නිරොධා ඵස්ස නිරොධො, ඵස්ස නිරොධා වෙදනා නිරොධො, වෙදනා නිරොධා, තණ්හා නිරොධො, තණ්හා නිරොධා, උපාදාන නිරොධො, උපදානා නිරොධා, භව නිරොධො, භව නිරොධා, ජාති නිරොධො, ජාති නිරොධා, ජරා මරණං සොක පරිදෙව දුක්ඛ දොමනස්සුපායාසා නිරුජ්ඣන්ති, ඒවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස, නිරොධො හොති.

අනෙක ජාති සංසාරං - සන්ධා විස්සං අනිබ්බිසං
ගහකාරකං ගවෙසන්තො - දුක්ඛා ජාති පුනප්පුනං
ගහකාරක දිට්ඨොසි - පුනගෙහං නකාහසි
සබ්බා තෙ ඵාසුකා භග්ගා - ගහකුටං විසං ඛිතං
විසං ඛාරගතං චිත්තං - තණ්හානං ඛය මජ්ඣගා ති.

## සුවිසිපට්ඨාන ධර්මය

හෙතු පච්චයො, ආරම්මණ පච්චයො, අධිපති පච්චයො, අනන්තර පච්චයො, සමනන්නතර පච්චයො, සහජාත පච්චයො, අඤ්ඤමඤ්ඤ පච්චයො, නිස්සය පච්චයො, උපනිස්සය පච්චයො, පුරෙජාත පච්චයො, පච්ඡාජාත පච්චයො, ආසෙවන පච්චයො, කම්ම පච්චයො, විපාක පච්චයො

ආහාර පච්චයො, ඉන්ද්‍රිය පච්චයො, ඣාන පච්චයො, මග්ග පච්චයො, සම්පයුත්ත පච්චයො, විප්පයුත්ත පච්චයො, අත්ථි පච්චයො, නත්ථි පච්චයො, විගත පච්චයො, අවිගත පච්චයොති,

එතෙන සච්චවජ්ජෙන සොත්ථි මේ හොතු සබ්බදා

## බුද්ධ වර්ෂය කීම

අම්හාකං ඛො පන භගවා දීපඞ්කර පාද මූලතො පට්ඨාය පඨමං දාන පාරමී. දුතියං සීල පාරමී. තතියං නෙක්ඛම්ම පාරමී. චතුත්ථං පඤ්ඤා පාරමී. පඤ්චමං විරිය පාරමී. ඡට්ඨමං ඛන්ති පාරමී. සත්තමං සච්ච පාරමී. අට්ඨමං අධිට්ඨාන පාරමී. නවමං මෙත්තා පාරමී. දසමං උපෙක්ඛා පාරමී'ති. දස පාරමියො දස උප පාරමියො දස පරමත්ථ පාරමියොති, සමතිංස පාරමියො පූරෙත්වා වෙස්සන්තරත්තභාවෙ නිබ්බත්තිත්වා පඤ්ච මහා පරිච්චාගෙ කත්වා තුසිත පුරෙ නිබ්බත්තිත්වා චතූහි මහා දෙව රාජූහි කතාරාධනං පටිච්ච පඤ්ච මහා විලොකනෙ විලොකෙත්වා සුද්ධොදන මහා රාජානං නිස්සාය මහාමායා දෙවියා කුච්ජිස්මිං පටිසන්ධිං ගණ්හිත්වා දසමාසච්චයෙන මාතු කුච්ජිතො නික්ඛමිත්වා එකූන තිංසතිමෙ සංවච්ජරෙ මහාභිනික්ඛමනං නික්ඛමිත්වා ඡබ්බස්සානි මහා පධානං පදහිත්වා පඤ්චතිංසති මෙ සංවච්ජරෙ වෙසාඛපුණ්ණමියං. සම්මා සම්බොධිං අභිසම්බුජ්ඣිත්වා පඤ්චචත්තාලීස සංවච්ජරානි වසිත්වා සප්ප සංවචජරෙ වෙසාඛ පුණ්ණමියං භුම්මාචාරෙ පරිනිබ්බායි.

තස්ස ඛො පන භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස සාසනං පඤ්චවස්ස සහස්සානි පවත්තිස්සති : ඉදානි ඛො පන ද්වෙ සහස්ස පඤ්චසත ද්වේචත්තලීසති සංවච්ජරානි ච එකූණවීසති දිවසානි අතික්ඛන්තානි.

ද්වෙ සහස්ස චතුසත සත්තපඤ්ඤාස සංවච්ජරානි චෙව එකා දස මාසානිච දස දිවසානි අවසිට්ඨානි අයං නාග සංවච්ජරෙ ගිම්හාන උතුඅස්මිං උතුම්හි ජෙට්ඨ මාසස්ස සුක්ක පක්ඛෙ පඤ්චමං සුක්ක වාරම්දන්ති දට්ඨබ්බං.

(1999 ජූනි 18 වෙනි සිකුරාදා දිනට ලැබෙන වර්ෂ මාස දින සහිත බුද්ධ වර්ෂ කථනයයි මේ.)

## විනාඩි 15 පමණ භාවනාවේ යෙදීම.

## දෙවියන්ට ඥාතීන්ට පින් අනුමෝදන් කිරීම.

**එත්තාවතාච අම්හෙහි - සම්භතං පුඤ්ඤ සම්පදං**
**සබ්බේ දේවා අනුමෝදන්තු - සබ්බේ සම්පත්ති සිද්ධියා**
**සබ්බේ භූතා අනුමෝදන්තු - සබ්බ සම්පත්ති සිද්ධියා**
**සබ්බේ සත්තා අනුමෝදන්තු - සබ්බ සම්පත්ති සිද්ධියා**

මෙතෙකින් අප විසින් රැස් කරන ලද පුණ්‍ය සම්පත්තිය සකල සම්පත් සිදුවීම පිණිස සියළු දෙවියෝද, සියළු භූතයෝද, සියළු සත්වයෝද අනුමෝදන් වෙත්වා!

**ආකාසට්ඨාච භුම්මට්ඨා - දේවා නාගා මහිද්ධිකා**
**පුඤ්ඤංතං අනුමෝදිත්වා - චිරං රක්ඛන්තු සම්බුද්ධ සාසනං**
**ආකාසට්ඨාච -පෙ- - චිරං රක්ඛන්තු සම්බුද්ධ දේසනං**
**ආකාසට්ඨාච -පෙ- - චිරං රක්ඛන්තු සම්බුද්ධ සාවකං**
**- චිරං රක්ඛන්තු මං පරං**

අහසෙහි විමන් හිද පොළොවෙහි වෘක්ෂ පර්වතාදියෙහි අධිගෘහිත වූද, මහත් සෘද්ධි ඇති දෙවියෝද, බ්‍රහ්මයෝද පින් අනුමෝදන්ව සාසනයද, ධර්මයද, ශ්‍රාවකයන්ද, මාද අන්‍යයන්ද යහතින් බොහෝ කල් රකිත්වා!

**ඉදං වෝ ඤාතීනං හෝතු - සුඛිතා හොන්තු ඤාතයෝ**

මේ පින නෑයන්ට අත්වේවා! නෑයෝ ලොව්තුරා සුවයෙන් සුවපත් වේවා!

**ඉමස්මිං විහාරේච ආරාමේ - අධිවත්තාච දේවතා**
**අනුමෝදිත්වා ඉමං පුඤ්ඤං - රක්ඛන්තු ජින සාසනං**

මේ විහාරාරාමයෙහි අධිගෘහිත දෙවියෝ මේ පින් අනුමෝදන්ව ජින සාසනය රකිත්වා!

## මෛත්‍රී බෝසතාණන් වහන්සේට පිංදීම

**කප්ප සත සහස්සානි - සෝලසාපි අසංඛියේ**
**සම්භරං බෝධි සම්භාරේ - ආගතෝ ජාති ජාති සො**
**නියතෝ බුද්ධ භාවාය - භද්දකප්පෙ ඉධන්තිමේ**
**බෝධි සත්ථොච මෙත්තෙය්‍යො - පුඤ්ඤං මේ අනුමෝදතු**

සොලසාසංඛ්‍ය කල්ප ලක්ෂයක් මුලුල්ලෙහි ජාතියක් ජාතියක් පාසා බෝධි සම්භාර ධර්ම රැස් කරමින් පැමිණියා වූ, මෙම මහා භද්‍ර කල්පයේ අන්තිම බුද්ධාන්තරයෙහි බුදුබව පිණිස නියත වූ මෛත්‍රී බෝධිසත්වයන් වහන්සේද මාගේ පින අනුමෝදන් වෙත්වා.

**සබ්බේ සත්තාච මජ්ඣත්තා - හිතාච අහිතා ච මේ**
**අනුමෝදිත්වා ඉමං පුඤ්ඤං - බුජ්ඣන්තු අමතං පදං**

සියළු සත්වයෝ ද, මාගේ හිත සත්වයෝ ද, මධ්‍යස්ථයෝද, අහිත සත්වයෝ ද මේ පින් අනුමෝදන්ව අමෘත පදය අවබෝධ කරත්වා!

## ප්‍රාර්ථනාව

**ඉමිනා පුඤ්ඤ කම්මෙන - මා මේ බාල සමාගමො**
**සතං සමාගමෝ හෝතු - යාව නිබ්බාන පත්තියා**

මෙම කුසලානුභාව බලයෙන් නිවන් දක්නා තුරු මා හට පාපමිත්‍ර සේවනයක් නොවේවා. කල්‍යාණ මිත්‍ර සේවනයම ලැබේවා.

## ප්‍රතිපත්ති පූජාව

**ඉමාය ධම්මානුධම්ම පටිපත්තියා බුද්ධං පූජේමි**
**ඉමාය ධම්මානුධම්ම පටිපත්තියා ධම්මං පූජේමි**
**ඉමාය ධම්මානුධම්ම පටිපත්තියා සංඝං පූජේමි**
**අද්ධා ඉමාය පටිපත්තියා ජාති ජරා මරණම්හා පරිමුච්චිස්සාමි**

මේ ධර්මානු ධර්ම ප්‍රතිපත්තියෙන් බුද්ධ රත්නය, ධර්ම රත්නය, සංඝ රත්නය පූජා කරමි. ඒකාන්තයෙන් මෙම ප්‍රතිපත්තියෙන් ජාති, ජරා මරණයෙන් අත මිදෙන්නෙමි.

## තෙරුවන් කමා කරවීම

**කායේන වාචා චිත්තේන - පමාදේන මයා කතං**
**අච්චයං ඛම මේ භන්තෙ - භූරිපඤ්ඤ තථාගත**

ස්වාමීනි මහා ප්‍රඥා තථාගතයන් වහන්ස! කයින්, වචනයෙන් සිතින් කරන ලද පමා වරදට මට ක්‍ෂමා වන සේක්වා!

**කායේන වාචා චිත්තේන - පමාදේන මයා කතං**
**අච්චයං ඛම මේ ධම්ම - සන්දිට්ඨික අකාලික**

සාන්දෘෂ්ඨික අකාලික ශ්‍රී සද්ධර්මය කෙරෙහි කයින් වචනයෙන් සිතින් කරන ලද පම වරදට ධර්ම රත්නය මට ක්‍ෂමා වන සේක්වා!

**කායේන වාචා චිත්තේන - පමාදේන මයා කතං**
**අච්චයං ඛම මේ සංඝ - පුඤ්ඤක්ඛෙත්ත අනුත්තර**

අනුත්තර දක්‍ෂිනාර්හ වූ මහා සංඝ රත්නය කෙරෙහි කයින් වචනයෙන් සිදු වූ පමා වරදට, සංඝ රත්නය මට ක්‍ෂමා වන සේක්වා!

## වැඩිහිටි-ගුරුවරුන් වැඳීම

**ඔකාස වන්දාමි භන්තෙ, ඔකාස ද්වාරත්තයෙන කතං සබ්බං අච්චයං ඛමථ මෙ භන්තෙ, ඔකාස ඛමාමි භන්තෙ**

අවසරයි ස්වාමීන් වහන්ස මම වන්දනා කරමි. අවසරයි ත්‍රිවිධද්වාරයෙන් වූ යම් ප්‍රමාද දෝෂයක් වේ නම් ක්‍ෂමාවන සේක්වා. මම ද ක්‍ෂමා වෙමි. දෙවනුවද, තෙවනුවද ක්‍ෂමා වන සේක්වා. මම ද ක්‍ෂමා වෙමි.

# දිවා වන්දනාව

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

ඒ භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදු රජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා.

**1. අනුච්චා චච සීලස්ස - නිපකස්සච ඣායිනො**
**චිත්තං යස්ස වසීභූතං - එකග්ගං සුසමාහිතං**

වැඩි අඩු නොවන සිල් ඇති ප්‍රඥාවන්ත වූ ධ්‍යාන කරණ සුලු යම් ඒ භාග්‍යවතුන් වහන්සේගේ සිත වසී වූයේද, මනාකොට අරමුණෙහි පිහිටියේ ද?

**2. තංවෙ තමොනුදංධීරං - තෙවිජ්ජං මච්චුහායිනං**
**හිතං දෙවමනුස්සානං - ආහුසබ්බප්පහායිනං**

ඒකාන්තයෙන් මොහඳුර දුරු කළ කෙලෙස් තවන වීර්‍ය්‍ය ඇති මරණය ඉක්මවූ දෙව් මිනිසුන්ට හිත වූ සියලු කෙලෙස් ප්‍රහාණය කළ ඒ භාග්‍යවතුන් වහන්සේ ත්‍රි විද්‍යා ඇත්තෙක් යයි බුද්ධාදී ආර්‍ය්‍යයෝ කියත්.

**3. තීහිවිජ්ජාහි සම්පන්නං - අසම්මූළ්හවිහාරිනං**
**බුද්ධං අන්තිමසාරීරං - තං නමස්සාමි ගොතමං**

ත්‍රි විද්‍යාවෙන් සමන්විත වූ, නොමුළා විහරණ ඇති අන්තිම සිරුර දරණ ඒ ගෞතම බුදුරජාණන් වහන්සේට මම වදිමි.

## බුදු ගුණ වන්දනාව

ඉතිපි සො පාඨය .........

## ධර්ම වන්දනාව

ස්වාක්ඛාතො පාඨය .........

## සංඝ වන්දනාව

සුපටිපන්නො පාඨය .........

## වත පිරිත

1. දසධම්ම සූත්‍රය - අතීත ප්‍රත්‍යවෙක්ෂාව .........

2. සුඛී භවෙය්‍යං නිද්දුක්ඛො - අහං නිච්චං අහං විය,
හිතාව මෙ සුඛී හොන්තු - මජ්ඣත්තාථච වෙරිනො.

ඉමම්හි ගාමක්ඛෙත්තම්හි - සත්තා හොන්තු සුඛී සදා.
තතො පරංච රජ්ජෙසු - චක්කවාළෙසු ජන්තුනො

සමන්තා චක්කවාළෙසු - සත්තානංතෙසු පාණිනො
සුඛිනොපුග්ගලා භූතා - අත්තභාව ගතාසියුං

තථා ඉත්ථි පුමාවෙච - අරියා අනරියාපිච
දෙවානරා අපායට්ඨා - තථා දසදිසාසුවාති

3. සුගතො වාදය (20 පිටුවෙන්)

4. පටික්කූල මනසිකාරය

අත්ථි ඉමස්මිං කායෙ

01. කෙසා, ලෝමා, නඛා, දන්තා, තචො
තචො, දන්තා, නඛා, ලෝමා, කේසා

02. මංසං, නහාරු, අට්ඨී, අට්ඨිමිඤ්ජා, වක්කං
වක්කං, අට්ඨිමිඤ්ජා, අට්ඨී, නහාරු, මංසං

03. හදයං, යකනං, කිලෝමකං, පිහකං, පප්ඵාසං
පප්ඵාසං, පිහකං, කිලෝමකං, යකනං, හදයං

04. අන්තං, අන්තගුණං, උදරියං, කරීසං, මත්ථලුංගං
මත්ථලුංගං, කරීසං, උදරියං, අන්තගුණං, අන්තං

05. පිත්තං, සෙම්හං, පුබ්බෝ, ලෝහිතං, සේදො, මේදො
මේදො, සේදො, ලෝහිතං, පුබ්බෝ, සෙම්හං, පිත්තං

06. අස්සු, වසා, ඛේලෝ, සිංඝාණිකා, ලසිකා, මුත්තං
මුත්තං, ලසිකා, සිංඝාණිකා, ඛේලෝ, වසා, අස්සු

★ දෙවියන්ට ඥාතීන්ට පින් දීම (23 පිටුව)

★ ප්‍රතිපත්ති පූජාව (24 පිටුව)

★ තෙරුවන් කෂමා කරවා ගැනීම (25 පිටුව)

වෘද්ධාපචායන

අභිවාදන සීලිස්ස - නිච්චං වද්ධාපචායිනො
චත්තාරො ධම්මා වඩ්ඪන්ති - ආයු වණ්ණො සුඛං බලං.

# සන්ධ්‍යා වන්දනාව

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

ඒ භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදු රජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා.

## ආරාධනාව

යාවතා භගවා ලොකෙ - තිට්ඨෙය්‍ය තව සාසනං
තාවතා පතිගණ්හාතු - පූජා ලොකානුකම්පයා

## පහන් පූජාව

ගන්ධ තෙලප්ප දිත්තෙන - දීපෙන තම ධංසිනා
තිලොක දීපං සම්බුද්ධං - පූජයාමි තමොනුදං

## සුවඳ පූජාව

සුගන්ධිකාය වදනං - අනන්ත ගුණ ගන්ධිනං
සුගන්ධිනාහං ගන්ධෙන - පූජයාමි තථාගතං

## පැන් පූජාව

සුගන්ධං සීතලං කප්පං - පසන්න මධුරං සුභං
පානීය මෙතං භගවා - පතිගණ්හාතු මුත්තම

## ගිලන්පස පූජාව

අධිවාසෙතු නො භන්තෙ - ගිලාන පච්චයං ඉමං
අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තම

අධිවාසෙතු නො භන්තෙ - පානකං පරිකප්පිතං
අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තම

# මල් පූජාව

**වණ්ණ ගන්ධ ගුණෝපේතං - එතං කුසුම සන්තතිං**
**පූජයාමි මුනින්දස්ස - සිරිපාද සරෝරුහේ**

**පූජේමි බුද්ධං කුසුමෙන නෙන**
**පුඤ්ඤෙන මෙතෙන ලභාමි මොක්ඛං**
**පුප්ඵං මිලායාති යථා ඉදං මෙ**
**කායො තථා යාති විනාස භාවං**

**නිරොධ සමාපත්තිතො වුට්ඨහිත්වා විය නිසින්නං භගවන්තං අරහන්තං සම්මා සම්බුද්ධං ඉමිනා පුප්ඵෙන පූජෙමි පූජෙමි පූජෙමි. අයං පුප්ඵ පූජා බුද්ධ පච්චෙක බුද්ධ අග්ග සාවක මහා සාවක අරහන්තාදීනං සභාවසීලං අහම්පි තෙසං අනුවත්තකො හොමි. ඉදං පුප්පං ඉදානි වණ්ණෙනපි සුවණ්ණං ගන්ධෙනපි සුගන්ධං සණ්ඨානෙනපි සුසණ්ඨානං ඛිප්පමෙව දුබ්බණ්ණං දුග්ගන්ධං දුස්සණ්ඨානං අනිච්චතං පාපුණිස්සති එවමෙව ඛො සබ්බෙ සංඛාරා අනිච්චා සබ්බෙ සංඛාරා දුක්ඛා සබ්බෙ ධම්මා අනත්තාති.**

නිරොධ සමාපත්තියෙන් නැගී වැඩ සිටින වැනි භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදුරජාණන් වහනසේට මේ මලින් පූජා කරමි. පූජා කරමි. පූජා කරමි. මේ මල් පූජාව බුදු පසේබුදු අගසව් මහ සව් රහත් ආදී උතුමන්ගේ ස්වභාව චාරිත්‍රයකි. මමද උන්වහන්සේලා අනුව පවතිමි.

දැන් මේ මල වර්ණයෙන්ද, යහපත් වර්ණ ඇත්තේය. සුවඳින්ද. මිහිරි සුවඳ ඇත්තේය. සටහනින්, මනහර සටහන් ඇත්තේය. එහෙත් තව මොහොතකින් දුර්වර්ණයටද, දුර්ගන්ධයටද, දුස්සණ්ඨානයටද, අනිත්‍ය භාවයටද පත් වන්නේය. එපරිද්දෙන්ම සියළු සංස්කාරයෝ අනිත්‍යයහ. දුඃඛයහ. සියලු ධර්මයෝ අනාත්මයහ.

(මේ සන්ධ්‍යා වන්දනාවේදී වන්දනාවට ප්‍රථමයෙන් පූජා පවත්වන ගාථාය. මෙයින් පිට තවත් පූජාවන් ඇතොත් සුදුසු පරිදි ඒ ඒ ගාථා කියා පූජාවන් කරනු)

# බුද්ධ වන්දනාව

**ඉතිපි සො භගවා අරහං සම්මා සම්බුද්ධො විජ්ජාචරණ සම්පන්නො සුගතො ලොක විදූ අනුත්තරො පුරිසදම්ම සාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවාති.**

**සො භගවා ඉතිපි අරහං වත සො භගවා, තං භගවන්තං අරහන්තං සිරසා නමාමි, තස්ස භගවතො අරහතො අත්තානං පරිච්චජාමි, පරිච්චත්තොයෙව මෙ අත්තා තස්ස භගවතො අරහතො, සාවකො හමස්මි සිස්සො හමස්මි.**

"ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස! ඔබ වහන්සේ මෙසේද අර්හත් නම් වන සේක. ඒකාන්තයෙන් අර්හත් නම් වන සේක. ඔබ වහන්සේට මාගේ නමස්කාරය වේවා! ඔබ වහන්සේට මාගේ ජීවිතය පූජා කරමි. පූජා වේවා! මම ඔබ වහන්සේගේ ශ්‍රාවක වෙමි. ශිෂ්‍යයෙක් වෙමි.

**ආරකත්තා හතත්තාච - කිලෙසාරීන සො මුනී**
**හත සංසාර චක්කාරො - පච්චයාදීන චාරහො**
**නරහො කරොති පාපානි - අරහං තං නමා මහං**

කෙලෙසුන් කෙරෙන් දුරු වූ හෙයින් ද, කෙලෙස් සතුරන් නැසූ හෙයින් ද, සංසාර චක්‍රය නැසූ හෙයින් ද, පූජාවන්ට සුදුසු වූ හෙයින් ද, රහසෙන් පවක් නැති හෙයින් ද, අර්හත් නම් වූ භාග්‍යවතුන් වහන්සේට නමස්කාර කරමි. නමස්කාර වේවා.

**සො භගවා ඉතිපි සම්මා සම්බුද්ධො, සම්මා සම්බුද්ධො වත සො භගවා, තං භගවන්තං සම්මා සම්බුද්ධං සිරසා නමාමි. තස්ස භගවතො සම්මා සම්බුද්ධස්ස අත්තානං පරිච්චජාමි. පරිච්චත්තොයෙව මෙ අත්තා තස්ස භගවතො සම්මා සම්බුද්ධස්ස, සාවකො හමස්මි සිස්සො හමස්මි.**

**සම්මා සම්බුද්ධ සද්ධම්ම - සම්මා සම්බුද්ධ දෙසන,**
**සම්මා සම්බුද්ධ සෙදයපස්ස - සම්මා සම්බුද්ධ තෙ නමො**

සකල සද්ධර්මය සර්වකාරයෙන් අවබෝධ කොට වදාළ වූ සම්මා සම්බුදුරජාණන් වහන්ස! ඔබ වහන්සේට මාගේ නමස්කාරය වේවා.

**සො භගවා ඉතිපි විජ්ජාචරණ සම්පන්නො විජ්ජාචරණ සම්පන්නො වත සො භගවා. තං භගවන්තං විජ්ජාචරණ සම්පන්නං සිරසා නමාමි. තස්ස භගවතො විජ්ජාචරණ සම්පන්නස්ස අත්තානං පරිච්චජාමි, පරිච්චත්තොයෙව මෙ අත්තා තස්ස භගවතො විජ්ජාචරණසම්පන්නස්ස, සාවකො හමස්මි සිස්සො හමස්මි.**

**විජ්ජාචරණ සම්පන්නො - තිස්සො විජ්ජා පකාසිතා**
**අට්ඨ විජ්ජා පඤ්ච දස - චරණං තං නමාමහං.**

ත්‍රිවිද්‍යා අෂ්ට විද්‍යාවෙකින් හා පසලොස් වර්ණ ධර්මයෙන් ද සමන්විත වූ විජ්ජාචරණ සම්පන්නයන් වහන්ස ! ඔබ වහන්සේට මාගේ නමස්කාරය වේවා !

**සො භගවා ඉතිපි සුගතො, සුගතො වත සො භගවා, තං භගවන්තං සුගතං සිරසා නමාමි, තස්ස භගවතො සුගතස්ස අත්තානං පරිච්චජාමි, පරිච්චත්තොයෙව මෙ අත්තා තස්ස භගවතො සුගතස්ස, සාවකො හමස්මි සිස්සො හමස්මි.**

**සුගතත්තා සුගත්තත්තා - සොභනා යස්සවා ගති**
**ගතත්තා සුන්දරං ඨානං - සුගතො නාම තෙ නමො**

ශෝභන වචන ඇති හෙයින් ද, ශෝභන ශරීර ඇති හෙයින් ද, ශෝභන ගමන් ඇති හෙයින් ද, සුන්දර නිවනට වැඩිය හෙයින් ද, සුගත නම් වූ භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේට මාගේ නමස්කාරය වේවා.

**සො භගවා ඉතිපි ලොකවිදූ, ලොකවිදූ වත සො භගවා තං භගවන්තං ලොකවිදුං සිරසා නාමාමි, තස්ස භගවතො ලොකවිදුනො අත්තානං පරිච්චජාමි, පරිච්චත්තොයෙව මෙ අත්තා තස්ස භගවතො ලොකවිදුනො, සාවකො හමස්මි, සිස්සො හමස්මි.**

**සත්තාවාසාදි සංඛාතෙ - කාමරූපාදිකෙ තථා**
**සංඛාර සත්ත මොකාස - ලොකෙ යො වෙදි තං නමෙ**

සත්ත්ව - සංස්කාර අවකාශ ලෝකයන් ද කාමරූප අරූපාදී සකල ලෝකයන් ද සර්වකාරයෙන් අවබෝධ කළ ලෝකවිදූන් වහන්ස. ඔබ වහන්සේට මාගේ නමස්කාරය වේවා.

**සො භගවා ඉතිපි අනුත්තරො පුරිසදම්ම සාරථී අනුත්තරො පුරිසදම්ම සාරථී වත සො භගවා, තං භගවන්තං අනුත්තරං පුරිසදම්ම සාරථිං සිරසා නමාමි, තස්ස භගවතො අනුත්තරස්ස පුරිසදම්ම සාරථිනො අත්තානං පරිච්චජාමි පරිච්චත්තොයෙව මෙ අත්තා තස්ස භගවතො අනුත්තරස්ස පුරිසදම්ම සාරථිනො, සාවකො හමස්මි, සිස්සො හමස්මි.**

**යෝ ලොකෙ අනුත්තරො දේව - බ්‍රහ්මා සුර නරොරගෙ**
**දමෙසි දම්මෙ පුරිසෙ - සාරථිං තං නමාමහං.**

ලොව දමනය කටයුතු වූ දෙව් බඹ සුර අසුර නර නාගාදීන් දමනය කළාවූ අනුත්තර පුරිසදම්ම සාරථීන් වහන්ස ! ඔබ වහන්සේට මාගේ නමස්කාරය වේවා !

**සො භගවා ඉතිපි සත්ථා දෙව මනුස්සානං, සත්ථා දෙව මනුස්සානං වත සො භගවා. තං භගවන්තං සත්ථාරං දෙව මනුස්සානං සිරසා නමාමි. තස්ස භගවතො සත්ථුනො දෙව මනුස්සානං අත්තානං පරිච්චජාමි. පරිච්චත්තොයෙව මෙ අත්තා තස්ස භගවතො සත්ථුනො දෙව මනුස්සානං සාවකො හමස්මි. සිස්සො හමස්මි.**

**දාතා තිභව සම්පත්තිං - නෙතා සිව පුරං වරං**
**සත්ථා දෙව මනුස්සානං - තං නමාමි නරුත්තමං**

ත්‍රිභව සම්පත් ගෙන දෙන්නා වූ, ශාන්ත නිවන් පුරයට පමුණුවන්නා වූ නරෝත්තම වූ දෙව් මිනිසුන්ගේ ශාස්තෘන් වහන්ස ඔබ වහන්සේට මාගේ නමස්කාරය වේවා !

**සො භගවා ඉතිපි බුද්ධො, බුද්ධො චත සො භගවා තං භගවන්තං බුද්ධං සිරසා නමාමි. තස්ස භගවතො බුද්ධස්ස අත්තානං පරිච්චජාමි. පරිච්චත්තොයෙව මෙ අත්තා තස්ස භගවතො බුද්ධස්ස සාවකො හමස්මි. සිස්සො හමස්මි.**

**චතුසච්ච මබුජ්ඣිත්ථ - බොධෙතා යො පජායච**
**සාමං සච්චානි සම්බුජ්ඣි - තං බුද්ධං පණමාමහං.**

චතුරාර්ය සත්‍ය අවබෝධ කළාවූද අන්‍යයන්ට අවබෝධ කරවූද, තමන් වහන්සේම සර්වප්‍රකාරයෙන් සත්‍ය අවබෝධ කළාවූ බුදුරජාණන් වහන්ස ! ඔබ වහන්සේට මාගේ නමස්කාරය වේවා !

**සො භගවා ඉතිපි භගවා, භගවා චත සො භගවා තං භගවන්තං භගවන්තං සිරසා නමාමි. තස්ස භගවතො භගවතො අත්තානං පරිච්චජාමි. පරිච්චත්තොයෙව මෙ අත්තා තස්ස භගවතො භගවතො, සාවකො හමස්මි, සිස්සො හමස්මි.**

**භාග්‍යවා භග්ගවා යුත්තෝ - භගේහිච විභත්ත වා**
**භවෙසු වන්න ගමනො - භගවා නාම තේ නමෝ**

පුණ්‍ය භාග්‍ය ඇත්තා වූද, මරුන් බිඳ දැමුවා වූද, භාග්‍ය ධර්මයෙන් යුක්තා වූද, ධර්මය බෙදා වදාළා වූද, භවගමන් වමාළා වූද භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේට මාගේ නමස්කාරය වේවා !

**අතීතායෙච සම්බුද්ධා - යෙච බුද්ධා අනාගතා**
**පච්චුප්පන්නාච යෙ බුද්ධා - අහං වන්දාමි සබ්බදා**

**නත්ථි මෙ සරණං අඤ්ඤං - බුද්ධො මෙ සරණං වරං**
**එතෙන සච්ච වජ්ජේන - හොතු මෙ ජයමංගලං**

**උත්තමංගෙන වන්දෙහං - පාදපංසු වරුත්තමං**
**බුද්ධෙ යො ඛලිතො දොසො - බුද්ධො ඛමතු තං මමං**

(තේරුම අඑයම වන්දනාවේ ඇත.)

සාධු ! සාධු ! සාධු !

# ධර්ම වන්දනාව

**ස්වාක්ඛාතො භගවතා ධම්මො සන්දිට්ඨිකො අකාලිකො එහි පස්සිකො ඕපනයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහීති.**

**ස්වාක්ඛාතො වත තස්ස භගවතො සො ධම්මො, සන්දිට්ඨිකො වත තස්ස භගවතො සො ධම්මො, අකාලිකො වත තස්ස භගවතො සො ධම්මො, එහි පස්සිකො වත තස්ස භගවතො සො ධම්මො, ඕපනයිකො වත තස්ස භගවතො සො ධම්මො, පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහි වත තස්ස භගවතො සො ධම්මො. තං ස්වාක්ඛාතං භගවතො ධම්මං සන්දිට්ඨිකං අකාලිකං එහිපස්සිකං ඕපනයිකං පච්චත්තං වෙදිතබ්බං විඤ්ඤූහි සිරසා නමාමි. තස්ස භගවතො ධම්මස්ස අත්තානං පරිච්චජාමි. පරිච්චත්තොයෙව මෙ අත්තා තස්ස භගවතො ධම්මස්ස සාවකො හමස්මි සිස්සො හමස්මි.**

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේගේ ශ්‍රී සද්ධර්ම රත්නය ඒකාන්තයෙන් "ස්වාක්ඛාත" නම් වන සේක. "සන්දිට්ඨික" නම් වන සේක. අකාලික නම් වන සේක. "ඒහිපස්සික" නම් වන සේක. "ඕපනයික" නම් වන සේක. "පච්චත්තං වෙදිතබ්බෝ විඤ්ඤූහි" නම් වන සේක. භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මරත්නයට මාගේ නමස්කාරය වේවා. මාගේ ජීවිතය ද පූජා කරමි. පූජා වේවා. මම ශ්‍රී සද්ධර්මරත්නයේ ශ්‍රාවකයෙක්මි. ශිෂ්‍යයෙක්මි.

**අතීතායෙව සද්ධම්මා - යෙච ධම්මා අනාගතා**
**පච්චුප්පන්නාච යෙ ධම්මා - අහං වන්දාමි සබ්බදා**

**නත්ථි මෙ සරණං අඤ්ඤං - ධම්මො මෙ සරණං වරං**
**එතනෙ සච්ච වජ්ජෙන - හොතු මෙ ජයමංගලං**

**උත්තමංගෙන වන්දෙහං - ධම්මංච තිවිධං වරං**
**ධම්මෙ යො ඛලිතො දොසො - ධම්මො ඛමතු තං මමං**

(තේරුම අළුයම වන්දනාවේ ඇත.)

සාධු ! සාධු ! සාධු !

# සංඝ වන්දනාව

**සුපටිපන්නො භගවතො සාවක සංඝො, උජුපටිපන්නො භගවතො සාවක සංඝො, ඤායපටිපන්නො භගවතො සාවක සංඝො, සාමීචිපටින්නො භගවතො සාවක සංඝො, යදිදං චත්තාරි පුරිස යුගානි අට්ඨ පුරිස පුග්ගලා එස භගවතො සාවක සංඝො ආහුනෙය්‍යො පාහුනෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො, අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති.**

**සුපටිපන්නො වත සො භගවතො සාවක සංඝො**
**උජුපටින්නො වත සො භගවතො සාවක සංඝො**
**ඤායපටිපන්නො වත සො භගවතො සාවක සංඝො**
**සාමීචිපටිපන්නො වත සො භගවතො සාවක සංඝො**
**ආහුනෙය්‍යො වත සො භගවතො සාවක සංඝො**
**පාහුනෙය්‍යො වත සො භගවතො සාවක සංඝො**
**දක්ඛිණෙය්‍යො වත සො භගවතො සාවක සංඝො**
**අඤ්ජලිකරණීයො වත සො භගවතො සාවක සංඝො**
**අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස**
**වත සො භගවතො සාවක සංඝො**
**තං භගවතො සාවක සංඝං සුපටිපන්නං උජුපටිපන්නං**
**ඤායපටිපන්නං සාමීචිපටිපන්නං ආහුනෙය්‍යං**
**පාහුනෙය්‍යං දක්ඛිනෙය්‍යං අඤ්ජලිකරණීයං අනුත්තරං**
**පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස සිරසා නමාමි.**

**තස්ස භගවතො සාවක සංඝස්ස අත්තානං පරිච්චජාමි**
**පරිච්චත්තොයෙව මෙ අත්තා තස්ස භගවතො සාවක**
**සංඝස්ස සාවකො හමස්මි සිස්සො හමස්මි**

ස්වාමීනි, භාග්‍යවතුන් වහන්ස ! ඔබ වහන්සේගේ අෂ්ටාර්‍ය පුද්ගල මහා සංඝරත්නය ඒකාන්තයෙන් "සුපටිපන්න" නම් වන සේක. "උජුපටිපන්න" නම් වන සේක. "ඤායපටිපන්න" නම් වන සේක. "සාමීචිපටිපන්න" නම් වන සේක. "ආහුණෙය්‍ය" නම් වන සේක. "පාහුණෙය්‍ය" නම් වන සේක. "දක්ඛිණෙය්‍ය" නම් වන සේක. "අඤ්ජලිකරණීය" නම් වන සේක. "අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලෝකස්ස" නම් වන සේක. ශ්‍රාවක සංඝරත්නයට

මාගේ නමස්කාරය වේවා. මාගේ ජීවිතය ද පූජා කරමි. පූජා වේවා. මම සංඝරත්නයේ ශ්‍රාවකයෙක්මි. ශිෂ්‍යයෙක්මි.

**යෙච සංඝා අතීතා ච - යෙච සංඝා අනාගතා**
**පච්චුප්පනාච යෙ සංඝා - අහං වන්දාමි සබ්බදා**
**නත්ථි මෙ සරණං අඤ්ඤං - සංඝො මෙ සරණං වරං,**

**එතනෙ සච්ච වජ්ජේන - හොතු මෙ ජයමංගලං**
**උත්තමංගෙන වන්දෙහං - සංඝංච තිවිධොත්තමං**
**සංඝෙ යො ඛලිතො දොසො - සංඝො ඛමතු තං මමං**

(තේරුම අළුයම වන්දනාවේ ඇත.)

සාධු ! සාධු ! සාධු !

## අටලොස් බුදුගුණ වන්දනාව

**අතීතංසෙ බුද්ධස්ස භගවතො අප්පටිහතං ඤාණං**
**අනාගතංසෙ බුද්ධස්ස භගවතො අප්පටිහතං ඤාණං**
**පච්චුපන්නංසෙ බුද්ධස්ස භගවතො අප්පටිහතං ඤාණං**

**ඉමෙහි තීහි ධම්මෙහි සමන්නාගතස්ස බුද්ධස්ස භගවතො, සබ්බ කාය කම්මං ඤාණ පුබ්බංගමං ඤාණානුපරිවත්තං සබ්බං වචීකම්මං ඤාණ පුබ්බංගමං ඤාණානු පරිවත්තං, සබ්බං මනො කම්මං ඤාණ පුබ්බංගමං ඤාණානුපරිවත්තං,**

**ඉමෙහි ඡහි ධම්මෙහි සමන්නාගතස්ස බුද්ධස්ස භගවතො. නත්ථි ඡන්දස්ස හානි, නත්ථි ධම්මදෙසනාය හානි නත්ථි විරියස්ස හානි නත්ථි සමාධිස්ස හානි නත්ථි පඤ්ඤාය හානි නත්ථි විමුත්තියා හානි.**

**ඉමෙහි ද්වාදසහි ධම්මෙහි සමන්නාගතස්ස බුද්ධස්ස භගවතො නත්ථි දවා නත්ථි රවා නත්ථි අප්ඵුටං නත්ථි වෙගායිතත්තං නත්ථි අබ්‍යාවට මනො නත්ථි අප්පටිසංඛානු පෙක්ඛා.**

**ඉමෙහි අට්ඨාරසහි ධම්මෙහි සමන්නාගතං සම්මා සම්බුද්ධං භගවන්තං සිරසා නමාමි.**

භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ඤාණය අතීත කොට්ඨාශයෙහි නොපැකිල පැවැත්තේය. භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ ඤාණය අනාගත කොට්ඨාශයෙහි නොපැකිල පවතින්නේය. භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ ඤාණය වර්තමාන කොට්ඨාශයෙහි නොපැකිල පවත්නේය.

මේ ධර්ම තුනෙන් සමන්වාගත වූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ කාය කර්මය නුවණ පෙරදැරිකොට ඇත්තේය. නුවණ අනුව පවත්නේය. වාක් කර්මයද, නුවණ පෙරදැරි කොට ඇත්තේය. නුවණ අනුව පවත්නේය. මනො කර්මයද නුවණ පෙරදැරි කොට ඇත්තේය. නුවණ අනුව පවත්නේය.

මේ ධර්ම සයෙන් සමන්වාගත වූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ ලෝවැඩ කිරීමෙහි වූ ඡන්දයේ පිරිහීමක් නැත්තේය. ධර්ම දේශනාවේ පිරිහීමක් නැත්තේය. වීර්‍යයේ පිරිහීමක් නැත්තේය. අර්හත් ඵල විමුක්තියේ පිරිහීමක් නැත්තේය.

මේ ධර්ම දොලොසින් සමන්වාගත වූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේගේ නුවණින් තොර වූ කායික වාචසික ක්‍රීඩා විකාරාදියක් නැත්තේය. නුවණින් තොරවූ යුහුසුළු ක්‍රියා ද නැත්තේය. නුවණින් ස්පර්ශ නොකළ ක්‍රියාවක්ද නැත්තේය. සිහියෙන් තොරව කරනු ලබන වේගවත් ක්‍රියා නැත්තේය. නිරර්ථක චිත්ත සමුදාචාර නැත්තේය. අඥාන උපේක්ෂා නැත්තේය.

මේ අටලොස් ධර්මයන්ගෙන් සමන්වාගත වූ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේට මම දොහොත් මුදුන් දී නමස්කාර කරමි.

සාධු ! සාධු ! සාධු !

**මායා සුතො සුගත සාකිය සීහනාථො**
**ජාතක්ඛණෙ සපදසා වහිසංකමිත්වා**
**යස්මිං උදීරයිගිරං වරලුම්බිණිම්හි**
**තං ජාත චෙතියමහං සිරසා නමාමි.**

මහාමායා දේවිතුමියගේ පුත් වූ ඒ ශෝභන ගමන් ඇති ශාක්‍ය සීහෝත්තම වූ ඒ සිද්ධාර්ථ නම් ගෞතමයන් වහන්සේ උපන් ඇසිල්ලෙහිදී සිය පයින් උතුරට සත් පියවරක් වැඩ අවසන්හි ලුම්බිණි උයනෙහි යම් තැනක සිට අග්ගො හමස්මි යනාදි වචනයන් ප්‍රකාශ කළේද එහි කරවන ලද චෛත්‍යයද ඒ පූජ්‍ය ස්ථානය ද මම මස්තක ප්‍රණාමයෙන්ම නමස්කාර කරමි.

**යස්මිං නිසජ්ජ වජිරාසන බන්ධනෙන**
**ජෙත්වා සවාසන කිලෙස බලං මුනින්දො**
**සම්බෝධි ඤාණමවගම්ම විහාසි සම්මා**
**තං බෝධි චෙතියමහං සිරසා නමාමි**

මුනීන්ද්‍රයන් වහන්සේ යම් තැනක වජ්‍රාසනය බැඳීමෙන් වැඩහිඳ වාසනා සහිත කෙලෙස් බලමුලුව ජයගෙන සර්වඥතා ඥානය ප්‍රත්‍යක්ෂ වශයෙන් මැනවින් අත්පත් කොට ගෙන වාසය කළ සේක් ද ඒ පූජ්‍යස්ථානයත් එහි කරවන ලද චෛත්‍යත් ශිර්ෂ ප්‍රණාමයෙන් නමස්කාර කරමි.

**සංකම්පයං දසසහස්සිය ලොක ධාතුං**
**දෙසෙසි යත්‍ර භගවා වර ධම්ම චක්කං**
**බාරාණසීපුර සමීප වනෙ මිගානං**
**තං ධම්ම චෙතියමහං සිරසා නමාමි**

භාග්‍යවතුන් වහන්සේ යම්තැනක වැඩ හිඳ ගෙන දස දහසක් ලෝක ධාතුන් කම්පා කරවමින් උතුම් වූ ධර්ම චක්‍රය දෙසූ සේක්ද, බරණැස් නුවර සමීප මුව වනයෙහි වූ ඒ පූජ්‍ය ස්ථානයද එහි කරවන ලද චෛත්‍යයද ශීර්ෂ ප්‍රණාමයෙන් නමස්කාර කරමි.

**කත්වාන ලොක හිතමත්ත හිතඤ්ච නාථො**
**ආසීතිකොච උපවත්තන කානනම්හි**
**යස්මිං නිපජ්ජ ගතවා නිරුපාධිසෙසං**
**නිබ්බාන චෙතියමහං සිරසා නමාමි**

ඒ ලෝකනාථ වූ සම්මා සම්බුදු රජාණන් වහනසේ තම වැඩ හා සකල ලෝකවාසීන්ගේ වැඩ ද කොට සියලු බුදුකිස නිමවා, උපතින් අසූ අවුරුදු ඇතිව උපවත්තන නම් සල්වනයෙහි යම් තැනක වැඩ හිඳ නිරුපාධිශේෂ පරිනිර්වාණ ධාතුවට පත් වූ සේක්ද, ඒ ස්ථානයද එහි බැඳි චෛත්‍යය ද ශීර්ෂ ප්‍රණාමයෙන් නමස්කාර කරමි.

සාධු ! සාධු ! සාධු !

# තෙ සැත්තෑ ඤාණ වන්දනාව

1. **සොතාවධාන පඤ්ඤා සුතමයෙ ඤාණං**

දහම් දෙසුමට කණ යොමු කිරීමේදී ප්‍රඥාව සුතමය ඤාණයයි.

2. **සුත්වාන සංවරෙ පඤ්ඤා සීලමයෙ ඤාණං**

ඇසීමෙන් සංවරවීමේ ප්‍රඥාව සීලමය ඤාණයයි.

3. **සංවරිත්වා සමාදහනෙ පඤ්ඤා සමාධි භාවනාමයෙ ඤාණං**

සංවර වීමෙන් සිත තැන්පත් කිරිමේ ප්‍රඥාව සමාධි භාවනාමය ඤාණයයි.

4. **පච්චය පරිග්ගහෙ පඤ්ඤා ධම්මට්ඨිති ඤාණං**

නාම රූපයන්ගේ ප්‍රත්‍ය ධර්මයන් ව්‍යවස්ථා කිරීමේ පැවැත් ප්‍රඥාවා ධම්මට්ඨිති ඤාණයයි.

5. **අතීතානාගත පච්චුප්පන්නානං ධම්මානං සංඛිපිත්වා වවත්ථානෙ පඤ්ඤා සම්මසනෙඤාණං**

අතීතවූද, අනාගතවූද, වර්තමානවූද, පඤ්චස්කන්ධ ධර්මයන් එකොලොස් තැනෙක කැටිකොට ව්‍යවස්ථා කිරීමේ ප්‍රඥාව සම්මසන ඥාණයයි.

6. **පච්චුප්පන්නානං ධම්මානං විපරිණාමානුපස්සනෙ පඤ්ඤා උදයබ්බයානු පස්සනෙ ඤාණං**

වර්තමාන වශයෙන් ලැබෙන්නා වූ පඤ්චස්කන්ධ ධර්මයන්ගේ භංගය නැවත නැවත නුවණින් බැලීමේ ප්‍රඥාව උදයබ්බයානු පස්සනාඥාණයයි.

7. **ආරම්මණං පටිසංඛා භංගානු පස්සනෙ පඤ්ඤ විපස්සනෙ ඤාණං**

රූපාදී ආරම්මණයන් බිඳෙන සැටි බලන ඥාණයේ භංගය නැවත නැවත නුවණින් සැලකීමේ ප්‍රඥාව භංගානුපස්සනා නම් විදර්ශනා ඥාණයයි.

8. **භයතුපට්ඨානෙ පඤ්ඤා ආදීනවෙ ඤාණං**

භය වශයෙන් වැටහීමේ ප්‍රඥාව ආදීනව ඥාණයයි.

9. **මුඤ්චිතු කම්‍යතා පටිසංඛා සන්තිට්ඨනා පඤ්ඤා සංඛාරුපෙක්ඛාසු ඤාණං**

මිදෙනු කැමැත්ත, ඊට උපාය සැලකීම, උපෙක්‍ෂා වශයෙන් නැවතීව යන තුන් ආකාරයක් ඇති ප්‍රඥාව සංඛාරුපෙක්ඛා ඥාණයයි.

10. **බහිද්ධා වුට්ඨාන විවට්ටනෙ පඤ්ඤා ගොත්‍රභුඤාණං**

බාහිර සංස්කාර නිමිත්තෙන් නැගී ආපසු හැරීමේ ප්‍රඥාව ගොත්‍රභූ ඥාණයයි.

**11. දුභතො වුට්ඨාන විවට්ටනෙ පඤ්ඤා මග්ගෙ ඤාණං**

නිමිත්ත පවත්ත දෙකින් නැගී පරාවර්තනය වන ප්‍රඥාව මාර්ග ඥාණයයි.

**12. පයොග පටිප්පස්සද්ධි පඤ්ඤා ඵලෙඤාණං**

බලවත් යෝග ක්‍රියාවන් නිමාවෙන් වූ ප්‍රඥාව ඵලඥාණයයි.

**13. ඡින්න වටුමාන පස්සනෙ පඤ්ඤා විමුත්ති ඤාණං**

සිඳින ලද කෙලෙස් වට නැවත සලකා බලන ප්‍රඥාව විමුක්ති ඥාණයයි.

**14. තදා සමුදාගතෙ ධම්මෙ පස්සනෙ පඤ්ඤා පච්චවෙක්ඛණෙ ඤාණං**

එකල එකතුවට පත් මගපල ආදී ධර්මයන් දැකීමේ ප්‍රඥාව පස්විකුම් ඥාණයයි.

**15. අජ්ඣත්ත වවත්ථානෙ පඤ්ඤා වත්ථු නානත්තෙ ඤාණං**

අධ්‍යාත්ම ධර්මයන් ව්‍යවස්ථා කරන ප්‍රඥාව වත්ථු නානත්ත ඥාණයයි.

**16. බහිද්ධා වවත්ථානෙ පඤ්ඤා ගොචර නානත්තෙ ඤාණං**

බාහිර වූ ඔවුන්ගේ විෂයයන් ව්‍යවස්ථා කරන ප්‍රඥාව ගොචර නානත්ත ඥාණයයි.

**17. චරියා වවත්ථානෙ පඤ්ඤා චරියා නානත්තෙ ඤාණං**

චර්යාවන් ව්‍යවස්ථා කරන ප්‍රඥාව චරියා නානත්ත ඥාණයයි.

**18. චතු ධම්ම වවත්ථානෙ පඤ්ඤාභූමි නානත්තෙ ඤාණං**

සතර සතර ප්‍රභේදවත් ධර්මයන් ව්‍යවස්ථා කරන ප්‍රඥාව භූමි නානත්ත ඥාණයයි.

**19. නව ධම්ම වවත්ථානෙ පඤ්ඤා ධම්ම නානත්තෙ ඤාණං**

නව නව ප්‍රභේදවත් ධර්මයන් ව්‍යවස්ථාකරන ප්‍රඥාව ධම්ම නානත්ත ඤාණයයි.

**20. අභිඤ්ඤා පඤ්ඤා ඤාතට්ඨෙ ඤාණං**

රුප්පනාදී ස්වභාවයෙන් පංචස්කන්ධාදි ධර්මයන් දක්නා ප්‍රඥාව ඤාතස්වභාව ඤාණයයි.

**21. පරිඤ්ඤා පඤ්ඤා තීරණට්ඨෙ ඤාණං**

සාමාන්‍ය ලක්ෂණාවබෝධයෙන් පැතිර දන්නා ප්‍රඥාව තීරණ ස්වභාව ඤාණයයි.

**22. පහානෙ පඤ්ඤා පරිච්චාගට්ඨෙ ඤාණං**

ප්‍රහාන ප්‍රඥාන පරිත්‍යාග ස්වභාව ඤාණයයි.

**23. භාවනා පඤ්ඤා එක රසට්ඨෙ ඤාණං**

භාවනා ප්‍රඥාව ඒකරස ස්වභාව ඤාණයයි.

**24. සච්ඡිකිරියා පඤ්ඤා ඵුසනට්ඨෙ ඤාණං**

ප්‍රත්‍යක්ෂ කරන ප්‍රඥාව වින්දන ස්වභාව ඤාණයයි.

**25. අත්ථ නානත්තෙ පඤ්ඤා අත්ථ පටිසම්භිදෙ ඤාණං**

අර්ථයන්ගේ නානා ස්වභාවයෙහි පැවති ප්‍රඥාව අර්ථ පටිසම්භිදා ඤාණයයි.

**26. ධම්ම නානත්තෙ පඤ්ඤා ධම්ම පටිසම්භිදෙ ඤාණං**

ධර්මයන්ගේ නානා ස්වභාවයෙහි පැවති ප්‍රඥාව ධර්ම ප්‍රතිසම්භිදා ඤාණයයි.

**27. නිරුත්ති නානත්තෙ පඤ්ඤා නිරුත්ති පටිසම්භිදෙ ඤාණං**

නිරුක්තීන්ගේ නා නා ස්වභාවයෙහි පැවැති ප්‍රඥාව නිරුක්ති ප්‍රතිසම්භිදා ඥාණයයි.

**28. පටිභාන නානත්තෙ පඤ්ඤා පටිභාන පටිසම්භිදෙ ඤාණං**

ප්‍රතිභානයන්ගේ නානාත්වයෙහි පැවති ප්‍රඥාව පටිභාන ප්‍රතිසම්භිදා ඥාණයයි.

**29. විහාර නානත්තෙ පඤ්ඤා විහාරට්ඨෙ ඤාණං**

නා නා විදර්ශනා විහරණ ප්‍රඥාව විහාර ස්වභාව ඥාණයයි.

**30. සමාපත්ති නානත්තෙ පඤ්ඤා සමාපත්තට්ඨෙ ඤාණං**

අනිමිත්තාදි නා නා සමාපත්ති පිළිබඳ ප්‍රඥාව සමාපත්ති ස්වභාව ඥාණයයි.

**31. විහාර සමාපත්ති නානත්තෙ පඤ්ඤා විහාර සමාපත්තට්ඨෙ ඤාණං**

විහාර සමාපත්ති දෙකම පිළිබඳව ප්‍රඥාව විහාර සමාපත්ති ස්වභාව ඥාණයයි.

**32. අවික්ඛෙප පරිසුද්ධත්තා ආසව සමුච්ඡෙදෙ පඤ්ඤා ආනන්තරික සමාධිම්හි ඤාණං**

සමාධියේම පිරිසිදුකමින් කාමාදී ආශ්‍රවන් සිඳලන්නාවූ ප්‍රඥාව ආනන්තරික සමාදියේ ඥාණයයි.

**33. දස්සනාධිපතෙය්‍යං සන්තොච විහාරාධිගමො පණීතාධිමුත්තතා පඤ්ඤා අරණ විහාර ඤාණං**

විදර්ශනාවේ අධිපති භාවය ද අධිගත වූ ශාන්ත රහත් ඵලය ද, ඵල සමවතෙහි අධිමුත්තිය ද යන මෙහි පැවති ප්‍රඥාව අරණ විහාර ඥාණයයි.

**34. ද්වීහි බලෙහි සමන්නාගතත්තා තයොච සංඛාරානං පටිප්පස්සද්ධියා සොළසහි ඤාණ චරියාහි නවහි සමාධි චරියාහි වසී භාවතා පඤ්ඤා නිරොධ සමාපත්තියා ඤාණං**

සමථ විදසුනෙන් පිරිපුන් හෙයින් ත්‍රිවිධ සංස්කාරයන්ගේ නිරෝධය සඳහා වූ, ඤාණ පැවතුම් සොළසකින්ද, සමාධි පැවතුම් නවයකින්ද වසී භාවය ඇති ප්‍රඥාව නිරෝධ සමාපත්ති ඤාණයයි.

**35. සම්පජානස්ස පවත්ත පරියාදානෙ පඤ්ඤා පරිනිබ්බානෙ ඤාණං**

සම්‍යක් ප්‍රකාරයෙන් දන්නා ප්‍රවර්තය සිඳින ප්‍රඥාව පරිනිබ්බානෙ ඤාණයයි.

**36. සබ්බ ධම්මානං සම්මා සමුච්ජෙදෙ නිරොධෙච අනුපට්ඨානතා පඤ්ඤා සමසීසට්ඨෙ ඤාණං**

සියලු තෙබුමු දහම් පිළිබඳ සන්තතිය සිඳීමෙන් මැනවින් නිරෝධය කළ කල යලි නූපැත්මේ ප්‍රඥාව සමසීස ස්වභාව ඤාණයයි.

**37. පුථු නානත්තතෙජ පරියාදානෙ පඤ්ඤා සල්ලෙඛට්ඨෙ ඤාණං**

ලොව්තුරු ගුණෙන් වෙනවූ රාගාදීන් ද, නානත්තවූ කාමච්ඡන්දාදීන් ද, තවන දුස්සීල්‍යාදීන් ගෙවාලන ප්‍රඥාව සල්ලෙඛ ඤාණයයි.

**38. අසල්ලීනත්ත පහිතත්ත පග්ගහට්ඨෙ පඤ්ඤා විරියාරම්භෙ ඤාණං**

නො හැකිළුනු සිතැතිවූ ද කාය ජීවිත නිරපේක්ෂායෙන් හළාවූද, තැනැත්තාගේ උත්සාහ ස්වභාවයේ ප්‍රඥාව විරියාරම්භ ඤාණයයි.

**39. නා නා ධම්මප්පකාසනතා පඤ්ඤා අත්ථ සන්දස්සනෙ ඤාණං**

නා නා ධර්මයන් ප්‍රකට කොට දක්වන ප්‍රඥාව අත්ථ සන්දස්සන ඤාණයයි.

**40. සබ්බ ධම්මානං එකසංගහතා නානත්තෙකත්ත පටිවෙධෙ පඤ්ඤා දස්සන විසුද්ධි ඤාණං**

සියලු ධර්මයන් එකතු කොට සංග්‍රහයෙහි ද නානාත්ව ඒකත්ව ධර්මයන්ගේ ප්‍රතිවෙධයේද ප්‍රඥාව දර්ශන විසුද්ධි ඥානයයි.

**41. විදිතත්තා පඤ්ඤා ඛන්ති ඤාණං**

රූපස්කන්ධාදිය දත් හෙයින් පැවති ප්‍රඥාව ඛන්ති ඥානයයි.

**42. ඵුට්ඨත්තා පඤ්ඤා පරියොගාහණෙ ඤාණං**

රූපස්කන්ධාදිය අනිත්‍ය සංඥාදියෙන් ස්පර්ශ කළ හෙයින් පැවති ප්‍රඥාව පරියෝගාහණ ඥානයයි.

**43. සමොදහනෙ පඤ්ඤා පදෙසවිහාරෙ ඤාණං**

ස්කන්ධාදීන්ගේ ඒකදේශයක් වන වේදනා ධර්මය පිඩු කොට සැලකීමේ ප්‍රඥාව ප්‍රදේශ විහාර ඥානයයි.

**44. අධිපතත්තා පඤ්ඤා සඤ්ඤා විවට්ටෙ ඤාණං**

නෙක්ඛම්මාදිය අධික වූයෙන් තදධික භාවයෙන් පැවති ප්‍රඥාව සඤ්ඤා විවට්ට ඥානයයි.

**45. නානත්තෙ පඤ්ඤා චෙතො විවට්ටෙ ඤාණං**

වැඩිය යුතු ධර්මයෙන් අන්‍ය ස්වභාව වූ කාමච්ඡන්දාදියෙහි ආදීනව දැක්මෙන් පැවති ප්‍රඥාව චෙතො විවට්ට ඥානයයි.

**46. අධිට්ඨානෙ පඤ්ඤා චිත්ත විවට්ටෙ ඤාණං**

නෙක්ඛම්මාදී වශයෙන් සිත පිහිටුවාලන ප්‍රඥාව චිත්ත විවට්ට ඥානයයි.

**47. සුඤ්ඤතෙ පඤ්ඤා ඤාණවිවට්ටෙ ඤාණං**

ආත්ම ආත්මීයත්ව ශූන්‍යතායෙන් අනාත්ම අනාත්මීයත්වයෙහි පැවති ප්‍රඥාව ඥාණ විවට්ට ඥානයයි.

**48. වොස්සග්ගෙ පඤ්ඤා විමොක්ඛ විවට්ටෙ ඤාණං**

කාමච්ඡන්දාදීන් හැරපීමෙන් නෙක්ඛම්මාදියෙහි පැවති ප්‍රඥාව විමොක්ඛ විවට්ට ඤාණයයි.

**49. තථට්ඨෙ පඤ්ඤා සච්ච විවට්ටෙ ඤාණං**

එක් එක් සත්‍යයෙක සතර සතර වැදෑරුම්ව ලැබෙන අවිපරීත ස්වභාවහි අසම්මෝහ කෘත්‍ය වශයෙන් පැවති ප්‍රඥාව සච්ච විවට්ට ඤාණයයි.

**විවට්ට ඤාණ ඡක්කයයි.**

**50. කායම්පි චිත්තම්පි එක වවත්ථානතා සුඛ සඤ්ඤඤ්ච ලහුසඤ්ඤඤ්ච අධිට්ඨාන වසෙන ඉජ්ඣනට්ඨෙ පඤ්ඤා ඉද්ධිවිධෙ ඤාණං**

රූප කයත් පාදක ධ්‍යාන සිතත් එකතු කොට ව්‍යවස්ථා කිරීමෙන් හා සුඛ සඤ්ඤාවටත් ලහුසඤ්ඤාවටත් ඇතුළුව සිටීමෙන්ද සිද්ධි ස්වභාවයෙහි පැවති ප්‍රඥාව ඉද්ධිවිධ ඤාණයයි.

**51. විතක්ක විප්ඵාර වසෙන නානත්තෙකත්ත සද්ද නිමිත්තානං පරියොගාහණෙ පඤ්ඤා සොත ධාතු විසුද්ධි ඤාණං**

තමාගේ විතර්ක වේගයන් අනුව නා නා ස්වභාව වූ ද ඒකස්වභාව වූද ශබ්ද නිමිත්තයනට ඇතුළුවීමේ ප්‍රඥාව සෝත ධාතු විසුද්ධි ඤාණයයි.

**52. තිණ්ණං චිත්තානං විප්ඵාරත්තා ඉන්ද්‍රියානං පසාදවසෙන නානත්තෙකත්ත විඤ්ඤාණචරියා පරියොගාහණෙ පඤ්ඤා චෙතොපරිය ඤාණං**

සොම්නස් දොම්නස් උපේක්ෂා යන තුන් සිතේ වේගයෙන්ද ෂඩින්ද්‍රියන්ගේ ප්‍රසන්න භාවයෙන් ද නා නා ස්වභාවවූද එක ස්වභාව වූද විඤ්ඤාණ චරියාවනට ඇතුළු වීමේ ප්‍රඥාව චෙතොපරිය ඤාණයයි.

**53. පච්චය පවත්තානං ධම්මානං නානත්තෙකත්ත කම්ම විප්ඵාර වසෙන පරියොගාහණෙ පඤ්ඤා පුබ්බෙ නිවාසානුස්සති ඤාණං**

නා නා ස්වභාව වූද, ඒක ස්වභාව වූද, කර්මයන්ගේ වේගය අනුව ප්‍රත්‍යයෙන් පැවති ධර්මයනට ඇතුළුවීමේ ප්‍රඥාව පුබ්බේ නිවාසානුස්සති ඤාණයයි.

**54. ඔභාස වසේන නානත්තෙකත්ත රූප නිමිත්තානං දස්සනට්ඨෙ පඤ්ඤා දිබ්බචක්ඛු ඤාණං**

කසිණාලෝකයේ බලයෙන් නා නා ස්වභාවවූද ඒක ස්වභාවවූද රූප නිමිති දන්නා ස්වභාවයෙන් පැවති ප්‍රඥා දිබ්බචක්ඛු ඤාණයයි.

**55. චතුසට්ඨියා ආකාරෙහි තිණ්ණන්නං ඉන්ද්‍රියානං වසීභාවතා පඤ්ඤා ආසවානං ඛයෙ ඤාණං**

සූසැට ආකාරයකින් ලෝකෝත්තර තුන් දෙනාගේ වසිභාවයෙහි පැවති ප්‍රඥාව ආසවක්ඛය ඤාණයයි.

**අභිඤ්ඤා ඤාණ සයයි.**

**56. පරිඤ්ඤට්ඨෙ පඤ්ඤා දුක්ඛෙ ඤාණං**

දුකෙහි පරිඤ්ඤා ස්වභාවයෙහි පැවති ප්‍රඥාව දුක්ඛෙ ඤාණයයි.

**57. පහානට්ඨෙ පඤ්ඤා සමුදයෙ ඤාණං**

සමුදයේ සිවුවැදෑරුම් ප්‍රහාතව්‍ය ස්වභාවයේ පැවති ප්‍රඥාව සමුදයේ ඤාණයයි.

**58. සච්ඡිකිරියට්ටේ පඤ්ඤා නිරොධෙ ඤාණං**

නිරෝධයේ සිවුවැදෑරුම් ප්‍රත්‍යක්ෂ කළයුතු ස්වභාවයෙහි පැවති ප්‍රඥාව නිරෝධයේ ඤාණයයි.

**59. භාවනට්ඨේ පඤ්ඤා මග්ගෙ ඤාණං**

මාර්ගයේ සිවුවැදෑරුම් ප්‍රත්‍යක්ෂ කළයුතු ස්වභාවයෙහි පැවති ප්‍රඥාව මාර්ගයේ ඥාණයයි.

**60. දුක්ඛෙ ඤාණං**

දුක්ඛ සත්‍යයෙහි පැවති ඥාණය

**61. දුක්ඛ සමුදයෙ ඤාණං**

දුක්ඛ සමුදයායැයි සත්‍යයෙහි පැවති ඥාණය

**62. දුක්ඛ නිරොධෙ ඤාණං**

දුක්ඛ නිරෝධායැයි සත්‍යයෙහි පැවති ඥාණය

**63. දුක්ඛ නිරොධ ගාමිනී පටිපදාය ඤාණං**

දුක්ඛ නිරෝධ ගාමිනී ප්‍රතිපදායැයි සත්‍යයෙහි පැවති ඥාණය

**සත්‍යඥාණ චතුෂ්ක දෙකයි.**

**64. අත්ථ පටිසම්භිදෙ ඤාණං**

අර්ථ ප්‍රතිසම්භිදාවෙහි පැවති ඥාණය

**65. ධම්ම පටිසම්භිදෙ ඤාණං**

ධර්ම ප්‍රතිසම්භිදාවෙහි පැවති ඥාණය

**66. නිරුත්ති පටිසම්භිදෙ ඤාණං**

නිරුත්ති ප්‍රතිසම්භිදාවෙහි පැවති ඥාණය

**67. පටිභාන පටිසම්භිදෙ ඤාණං**

ප්‍රතිභාන ප්‍රතිසම්භිදාවෙහි පැවති ඥාණය

**ශුද්ධික ප්‍රතිසම්භිදා සතරයි**

68. **ඉන්ද්‍රිය පරොපරියත්තෙ ඤාණං**

විනෙ දනන්ගේ ශ්‍රද්ධාදී ඉන්ද්‍රියන් පිළිබඳ උසස් පහත් බව දන්නා ඤාණය

69. **සත්තානං ආසයානුසයෙ ඤාණං**

සත්වයන්ගේ ආසය අනුසය දන්නා ඤාණය

70. **යමක පාටිහාරියෙ ඤාණං**

යමා මහ පෙළහැර දක්වීමේදී පැවති ඤාණය

71. **මහා කරුණා සමාපත්තියා ඤාණං**

මහා කුළුණු සමවත් ඤාණය

72. **සබ්බඤ්ඤුත ඤාණං**

සර්වඥතා ඤාණය

73. **අනාවරණ ඤාණන්ති**

අනාවරණ ඤාණය

**ඉමානි තෙසත්තති ඤාණානි. ඉමෙසං තෙසත්තතියා ඤාණානං සත්ත සට්ඨි ඤාණානි සාවක සාධාරණානි, ඡ ඤාණානි අසාධාරණානි සාවකෙහි ඉමෙහි තෙසත්තතියා ඤාණෙහි සමන්නාගතං සම්මා සම්බුද්ධං භගවන්තං සිරසා නමාමි.**

මොවුහු තුන් සැත්තෑවක් ඤාණයෝය. මෙයින් සැට සතක් ඤාණයෝ ශ්‍රාවක සාධාරණයහ. ඤාණ සයක් ශ්‍රාවකයන් හා අසාධාරණයහ. මේ තුන් සැත්තෑවක් ඤාණයෙන් සමන්විත වූ භාග්‍යවත් සම්මා සම්බුදුරජාණන් වහන්සේට දොහොත් මුදුන් තබා නමස්කාර කරමි.

සාධු ! සාධු ! සාධු !

1. වත පිරිත - කරණීය මෙත්ත සූත්‍රය

2. දසධම්ම සූත්‍රයේ සිට චුන්ද බොජ්ඣංගය තෙක් දිනකට එක සූත්‍රය බැගින් සජ්ඣායනා කරන්න.

3. මොර පිරිතේ අපරාර්ධය

4. කඳ පිරිත - නිමවා ඉන් අනතුරුව

## ආරක්‍ෂක පිරිත් සජ්ඣායනාව

1. විපස්සිස්ස නමත්ථු - චක්ඛු මන්තස්ස සිරීමතො
සිඛිස්සපි නමත්ථු - සබ්බ භූතානු කම්පිනො

2. වෙස්සභුස්ස නමත්ථු - නහාතකස්ස තපස්සිනො
නමත්ථු කකුසන්ධස්ස - මාරසෙනා පමද්දිනො

3. කොණාගමනස්ස නමත්ථු - බ්‍රාහ්මණස්ස වුසීමතො
කස්සපස්ස නමත්ථු - විප්පමුත්තස්ස සබ්බධි

4. අංගීරසස්ස නමත්ථු - සක්‍ය පුත්තස්ස සිරීමතො
නමො තෙසං සත්තන්නං - සම්මා සම්බුද්ධානන්ති

1. පඨවි බල සුන්දරී - සබ්බසද්සදු බොධි මණ්ඩලං
අසංඛෙය්‍යං මාරසෙනං - ජයො ජයතු මංගලං

2. කකුසන්ධො කොණාගමනො - කස්සපො ගොතමො මුනී
මෙත්තෙය්‍යො පඤ්ච බුද්ධා තෙ - සීසෙ මෙ සෙන්තු සබ්බදා

3. එතෙසං අනුභාවෙන - යක්ඛා දෙවා මහිද්ධිකා
සබ්බෙපි සුඛිතා හොන්තු - මම මිත්තා සහායකා

4. සම්බුද්ධෙ අට්ඨවීසංච - ද්වාදසංච සහස්සකෙ
පඤ්ච සත සහස්සානි - නමාමි සිරසා දරං

5. අප්පකා වාලුකා ගංගා - අනන්තා නිබ්බුතා ජිනා
තෙසං ධම්මංච සංඝංච - ආදරෙන නමාම්‍යහං

6. නමක්කාරානුභාවෙන - හිත්වා සබ්බෙ උපද්දවෙ
අනෙකා අන්තරායාපි - විනස්සන්තු අසෙසතො

7. ඛන්ති පරමං තපො තිතික්ඛා - නිබ්බානං පරමං වදන්ති බුද්ධා
නහි පබ්බජිතො පරූපඝාති - සමණො හොති පරං විහෙඨයන්තො

8. සබ්බ පාපස්ස අකරණං - කුසලස්ස උපසම්පදා
සචිත්ත පරියොදපනං - එතං බුද්ධාන සාසනං

9. අනූපවාදො අනූපඝාතො - පාතිමොක්ඛෙ ච සංවරො
මත්තඤ්ඤුතා ච භත්තස්මිං - පන්ථඤ්ච සයනාසනං,
අධිචිත්තෙ ච ආයොගො - එතං බුද්ධානං සාසනං

10. සබ්බේ සංඛාරා අනිච්චාති - යදා පඤ්ඤාය පස්සති
අථ නිබ්බින්දති දුක්ඛෙ - එස මග්ගො විසුද්ධියා

11. සබ්බෙ සංඛාරා දුක්ඛාති - යදා පඤ්ඤාය පස්සති
අථ නිබ්බින්දති දුක්ඛෙ - එස මග්ගො විසුද්ධියා

12 සබ්බෙ ධම්මා අනත්තාති - යදා පඤ්ඤාය පස්සති
අථ නිබ්බින්දති දුක්ඛෙ - එස මග්ගො විසුද්ධියා

★ ඉමිනා පුඤ්ඤ කම්මෙන - උපජ්ඣායා ගුණුත්තරා ...

(අළුයම වන්දනාවේ එන පුණ්‍යානුමෝදනා ගාථා - 18 පිටුව)

★ අප්පමාදේන භික්ඛවේ සම්පාදේථ ...

(සුගතෝවාදය - 20 පිටුව)

★ විනාඩි 15 පමණ භාවනාවේ යෙදීම

★ **දෙවියන්ට, ඥාතීන්ට හා සියළු සත්වයන්ට පින්දීම**
(අළුයම වන්දනාවේ ඇත. - 23 පිටුව)

**එත්තාවතාව අම්හෙහි ...........**
**අකාසට්ඨාව භුම්මට්ඨා ...........**
**ඉදං වො ඤාතීනං ...........**
**කප්ප සත සහස්සානි ...........**
**ඉමස්මිං විහාරේච ...........**
**සබ්බේ සත්තාච මජ්ඣත්තා ...........**

★ **යං පත්තං කුසලං තස්ස - ආනුභාවේන පාණිනො**
**සබ්බෙ සද්ධම්ම රාජස්ස - ඤත්වා ධම්මං සුඛා වහං**

★ **පාපුණන්තු විසුද්ධාය - සුඛාය පටිපත්තියා**
**අසොක මනුපායාසං - නිබ්බාන සුඛ මුත්තමං**

රැස්කරගනු ලැබුණා වූ යම් කුසලයක් වේ නම්, එහි ආනුභාවයෙන් සියළු සැපගෙන දෙන්නා වූ ශ්‍රී සද්ධර්මය අසා, සුවිශුද්ධ වූ සැප ප්‍රතිපදාවෙන් උතුම් වූ සැපය වූ නිර්වාණයට සියළු සත්වයෝ පැමිණෙත්වා !

★ **චිරං තිට්ඨතු සද්ධම්මො - ධම්මෙ හොන්තු සගාරවා**
**සබ්බේපි සත්තා කාලේන - සම්මා දේවෝ පවස්සතු**

සද්ධර්මය බොහෝ කාලයක් ලොව පවතීවා. සියලු සත්වයෝ බුද්ධ ධර්මය කෙරෙහි ගරු ඇත්තේ වෙත්වා. යහපත් සේ වර්ෂාව පවතීවා.

★ **යථා රක්ඛිංසු පොරාණා - සුරා ජානො තථෙවිමං**
**රාජා රක්ඛතු ධම්මෙන - අත්තනොව පජං පජං**

යම් සේ අතීතයේ ධාර්මික රජවරු ජනතාව රැක්කාද, එසේම වර්තමාන රජතුමාද ස්වකීය දරුවන් මෙන් වර්තමාන ජනතාව රකීවා.

★ **වීරං තිට්ඨතු ලොකස්මිං - සම්මා සම්බුද්ධ සාසනං**
**තස්මිං සගාරවා නිච්චං - හොන්තු සබ්බෙපි පාණිනො**

සද්ධර්මය බොහෝ කාලයක් පවතිත්වා. රජු ධාර්මික වෙත්වා. සියළුප්‍රාණීහු ධර්මයේ හැසිරෙත්වා.

★ **සම්මා වස්සතු කාලෙන - දෙවො ච ජගතී පති**
**සද්ධම්ම නිරතො ලොකං - ධම්මෙනෙව පසාසතු.**

කාලයට වැසි වසිත්වා. රජු ධාර්මික වෙත්වා. ලෝකයාට හිත සුව පිණිස සද්ධර්මය බොහෝ කලක් ලෝකයේ පවතීවා.

★ **ප්‍රාර්ථනාව**

ඉමිනා පුඤ්ඤ කම්මෙන .... (24 පිටුව)

★ **ප්‍රතිපත්ති පූජාව**

ඉමාය ධම්මානුධම්ම පටිපත්තියා .... (24 පිටුව)

★ **තෙරුවන් කමා කරවා ගැනීම** (25 පිටුව)

## පින් අනුමෝදන් වීම සහ අනුමෝදන් කරවීම

නවක - ඔකාස වන්දාමි භන්තෙ, මයාකතං පුඤ්ඤං සාමිනා අනුමොදිතබ්බං

වෘද්ධ - සාධු ! සාධු ! සාධු ! අනුමොදාමි.

නවක - සාමිනා කතං පුඤ්ඤං මය්හං දාතබ්බං

වෘද්ධ - සාධු අනුමොදාහි

නවක - සාධු සාධු අනුමෝදාමි
ඔකාස ද්වාරත්තයෙන කතං සබ්බං අච්චයං ඛමථ මෙ භන්තෙ

වෘද්ධ - ඛමාමි ඛමි තබ්බං

නවක - ඔකාස ඛමාමි භන්තෙ

### සිංහල තේරුම

නවක - අවසරයි ස්වාමීන් වහන්ස ! මම වදිමි. මා විසින් කරන ලද පින ස්වාමීන් වහන්සේ අනුමෝදන් වන සේක්වා.

වෑද්ධ - සාධු ! සාධු ! අනුමෝදන් වෙමි.

නවක - ස්වාමීන් වහන්සේ විසින් කරන ලද පින මට දෙන සේක්වා.

වෑද්ධ - සාධු ! සාධු ! සාධු ! අනුමෝදන් වන්න.

නවක - සාධු ! සාධු ! සාධු ! අනුමෝදන් වෙමි.

නවක - අවසරයි ස්වාමීන් වහන්ස ! මාගේ තිදොරින් යම් ප්‍රමාද දෝෂයක් වූයේ නම් ක්‍ෂමා වන සේක්වා.

වෑද්ධ - ක්‍ෂමා වෙමි, ක්‍ෂමා වන්න.

නවක - සාධු ! සාධු ! සාධු ! ක්‍ෂමා වෙමි. ස්වාමීන් වහන්ස!

## වර්ෂ දොළසේ නම්

මූසිකො වසභො ව්‍යග්ඝ
සස නාගානි මෙවච
සප්පස්සජ කපී වෙච
කුක්කුටො සොණ සූකරො

| | | |
|---|---|---|
| 1. මූසික | 5. නාග | 9. කපි |
| 2. වසභ | 6. සප්ප | 10. කුක්කුට |
| 3. ව්‍යග්ඝ | 7. අස්ස | 11. සොණ |
| 4. සස | 8. අජ | 12. සූකර |

## මාස

| පාළි | සිංහල | ඍතු |
|---|---|---|
| 1. චිත්ත | - බක් | ගිම්හාන |
| 2. වෙසාඛ | - වෙසක් | |
| 3. ජෙට්ඨ | - පොසොන් | |
| 4. අසාළ්හ | - ඇසළ | |
| 5. සාවන | - නිකිනි | වස්සාන |
| 6. පොට්ඨපාද | - බිනර | |
| 7. අස්සයුජ | - වප් | |
| 8. කත්තික | - ඉල් | |
| 9. මාගසිර | - උඳුවප් | හේමන්ත |
| 10. ඵුස්ස | - දුරුතු | |
| 11. මාඝ | - නවම් | |
| 12. ඵග්ගුන | - මැදින් | |

## දින නාම

සිංහල - 1

1. රවි දින
2. සඳු දින
3. කුජ දින
4. බුධ දින
5. ගුරු දින
6. කිවි දින
7. ශනි දින

පාළි

1. රවිවාරො
2. චන්දවාරො
3. භුම්මවාරො
4. බුධවාරො
5. ගුරුවාරො
6. සුක්කවාරො
7. සොරවාරො

# සම්මා සම්බෝධි වන්දනාව

## නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස !!!

ඉතිපිසො භගවා අරහං සම්මාසම්බුද්ධො විජ්ජාචරණ සම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්ම සාරථී සත්ථා දේවමනුස්සානං බුද්ධො භගවාති.

ස්වාක්ඛාතො භගවතා ධම්මො සන්දිට්ඨිකො අකාලිකො ඒහිපස්සිකො ඕපනයිකො පච්චත්තං වේදිතබ්බො විඤ්ඤූහීති.

සුපටිපන්නො භගවතො සාවකසංඝො - උජුපටිපන්නො භගවතො සාවකසංඝො - ඤායපටිපන්නො භගවතො සාවකසංඝො - සාමීචිපටිපන්නො භගවතො සාවකසංඝො - යදිදං චත්තාරි පුරිසයුගානි අට්ඨපුරිස පුග්ගලා එසභගවතො සාවක සංඝො ආහුණෙය්‍යො පාහුණෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්සාති.

සාධු ! සාධු !! සාධු !!!

## බෝධි වන්දනාව

**යස්ස මූලෙ නිසින්නොව**
**සබ්බාරි විජයං අකා**
**පත්තො සබ්බඤ්ඤුතං සත්ථා**
**වන්දෙ තං බොධි පාදපං**

**ඉමෙ එතෙ මහා බොධි**
**ලොක නාථෙන පූජිතා**
**අහම්පි තෙ නමස්සාමි**
**බොධි රාජා නමත්ථු තෙ**

පඨමං බොධි පල්ලඩ්ඩං
දුතියඤ්ච අනිම්මිසං
තතියං චංකමනං සෙට්ඨං
චතුත්ථං රතනාඝරං

පඤ්චමං අජපාලඤ්ච
මුචලින්දෙන ඡට්ඨමං
සත්තමං රාජායතනං
වන්දෙ තං මුනි සෙවිතං

මහා කාරුණාරස පතිමණ්ඩිතස්ස අනන්තඤාණස්ස අසාධාරණ පඤ්ඤස්ස දසපාරමිතා බල සමුදිතස්ස දසබල සමන්නාගතස්ස අපරිමෙය්‍ය ගුණසාගරස්ස අම්හාකං සත්ථුනො සරස රංසිජාල පරිකිණ්ණං සම්මාසම්බුද්ධ පූජිතං සිරිබොධිරාජං සිරසා නමාමි.

සාධු ! සාධු !! සාධු !!!

ඉන්දනීල වණ්ණ පත්ත සෙත ඛන්ධ භාසුරං
සත්ථු නෙත්ත පංකජාභි පූජිතග්ග සාතදං
අග්ගබෝධි නාම වාම දෙව රුක්ඛ සන්නිභං
තං විසාල බොධි පාද පං නමාමි සබ්බදා

සුපතිට්ඨිත රට්ඨනුරාධ පුරෙ
සමදිට්ඨිත දක්ඛිණසාඛභවං
සුභ මේඝවනම්බර මේඝනිභං
ජය බොධිමහං පණමාමි වරං

වන්දාමි චේතියං සබ්බං - සබ්බඨානෙසු පතිට්ඨිතං
සාරීරික ධාතු මහා බෝධිං - බුද්ධරූපං සකලං සදා !!!

සාධු ! සාධු !! සාධු !!!

සෙවිතං ධම්ම රාජෙන - පත්තුං සම්බොධි මුත්තමං
වන්දාමි බෝධි රාජානං - නිබ්බාන සුඛ සිද්ධියා.

## පහන් පූජාව :

සෙවිතං ධම්ම රාජෙන - පත්තුං සම්බොධි මුත්තමං
පූජෙමි බොධි රාජානං - දීපාලොකෙන සාදරං

## සුවඳදුම් පූජාව :

සෙවිතං ධම්ම රාජෙන - පත්තුං සම්බෝධි මුත්තමං
පූජෙමි බොධි රාජානං - ගන්ධ ධූපෙන සාදරං

## මල් පූජාව :

සෙවිතං ධම්ම රාජෙන - පත්තුං සම්බෝධි මුත්තමං
පූජෙමි බොධි රාජානං - ගන්ධ පුප්ඵේන සාදරං

## මල්දම් පූජාව :

සෙවිතං ධම්ම රාජෙන - පත්තුං සම්බෝධි මුත්තමං
පූජෙමි බෝධි රාජානං - පුප්ප දාමෙන සාදරං

## කොඩි පූජා :

සෙවිතං ධම්ම රාජෙන - පත්තුං සම්බෝධි මුත්තමං
පූජෙමි බොධි රාජානං - ධජෙනෙතෙන සාදරං

## අෂ්ටපාන ගිලන්පස :

සෙවිතං ධම්ම රාජෙන - පත්තුං සම්බෝධි මුත්තමං
පූජෙමි බොධි රාජානං - අට්ඨ පානෙන සාදරං

## සුවඳ පැන් පූජාව :

සෙවිතං ධම්ම රාජෙන - පත්තුං සම්බෝධි මුත්තමං
පූජෙමි බෝධි රාජානං - ගන්ධොදකේන සාදරං

## පූජා වාක්‍ය :

මහා කාරුණික වූ ශාන්තිනායක ධර්මරාජයාණන් වහන්සේ විසින් සර්වඥතාඥානයට පැමිණීම පිණිස සේවනය කරන ලද බෝධිරාජයාණන් වහන්සේට මේ පහන් ආලෝකයෙන් පූජාකරමි. පූජාවේවා. මේ සුගන්ධ ධූපයෙන් පූජා කරමි. පූජා වේවා. මේ සුවඳ මල් සමූහයෙන් පූජා කරමි. පූජා වේවා. මේ විසිතුරු මල්දම් සමූහයෙන් පූජා කරමි. පූජා වේවා. මේ ප්‍රණීත අෂ්ටපාන ගිලන් පසෙන් පූජා කරමි. පූජා වේවා. මේ සුවඳ පැන් අභිසේකයෙන් පූජා කරමි. පූජා වේවා.

මෙසේ බෝධි පූජා කිරීම බුදු පසේ බුදු අගසව් මහසව් මහරහත් ආදී මහෝත්තමයාණන් වහන්සේලාගේ චාරිත්‍ර සීලයකි. මම ද ඒ උතුම් චාරිත්‍ර සීලය මෙසේ අනුගමනය කරමි. මේ ප්‍රණීත පූජා වස්තු සමූහය ස්වල්ප මොහොතකින් අනිත්‍යත්වයට යන්නා සේ සියලු සංස්කාරයෝ අනිත්‍යයෝය. සියලු සංස්කාරයෝ දුක්ඛයෝය. සියලු ධර්මයෝ අනාත්මයෝය.

මේ බෝධි පූජාමය කුශලය බුදු, පසේ බුදු, මහරහත් වහන්සේලා තිවී සැනසී පැමිණ වදාළා වූ පරමරමණීය වූ ශාන්ති ලක්ෂණ වූ නිර්වාණ අභය පුරයට පැමිණීම පිණිසම හේතු වේවා ! වාසනා වේවා !

සාධු ! සාධු !! සාධු !!!

## සෙත් පැතීම

1. **ජයො මුනින්දස්ස සුබෝධි මුලෙ**
**අහොසි මාරස්ස පරාජයො හි**
**උග්ඝොසයුං බොධි මණ්ඩෙ පමොදිතා**
**ජයං තදා නාග ගණාමහෙසිනො**
**එතෙන සච්චෙන සුවත්ථි හොතු**

2. ජයො මුනින්දස්ස සුබොධි මූලෙ
අහොසි මාරස්ස පරාජයො හි
උග්ඝොසයුං බොධි මණ්ඩෙ පමොදිතා
සුපණ්ණ සංඝාපි ජයං මහෙසිනො
එතෙන සච්චෙන සුවත්ථි හොතු.

3. ජයො මුනින්දස්ස සුබොධි මූලෙ
අහොසි මාරස්ස පරාජයො හි
උග්ඝොසයුං බොධි මණ්ඩෙ පමොදිතා
ජයං තදා දෙව ගණා මහෙසිනො
එතෙන සච්චෙන සුවත්ථි හොතු

4. ජයො මුනින්දස්ස සුබොධි මූලෙ
අහොසි මාරස්ස පරාජියො හි
උග්ඝොසයුං බොධි මණ්ඩෙ පමොදිතා
ජයං තදා බ්‍රහ්ම ගණාපි තාදිනො
එතෙන සච්චෙන සුවත්ථි හොතු

සාධු ! සාධු !! සාධු !!!

කරණීය මෙත්ත සූත්‍රය .............
ඉදං වො ඤාතීනං හොතු .............
එත්තාවතා ච අම්හෙහි .............
ආකාසට්ඨා ච භුම්මට්ඨා .............
ඉමිනා පුඤ්ඤ කම්මෙන .............
ඉදං මෙ පුඤ්ඤ කම්මං .............
ඉමාය ධම්මානු ධම්ම පටිපත්තියා .............
කායෙන වාචා චිත්තෙන .............

# ජයමංගල ගාථා

1. බාහුං සහස්ස මභිනිම්මිත සායුධං තං
ගිරිමෙඛලං උදිතඝොර **සසෙනමාරං**
දානාදිධම්මවිධිනා ජිතවා මුනින්දො
තං තෙජසා භවතු මෙ ! ජයමංගලානි.

2. මාරාතිරෙක මභියුජ්ඣිත සබ්බරත්තිං
**ඝොරම්පනාලවක** මක්ඛ මථද්ධයක්ඛං
ඛන්තී සුදන්තවිධිනා ජිතවා මුනින්දො
තං තෙජසා භවතු මෙ ! ජයමංගලානි.

3. **නාලාගිරිං** ගජවරං අතිමත්තභූතං
දාවග්ගිචක්ක මසනීව සුදාරුණං තං
මෙත්තම්බුසෙකවිධිනා ජිතවා මුනින්දො
තං තෙජසා භවතු මෙ ! ජයමංගලානි

4. උක්ඛිත්ත ඛග්ගමතිහත්ථ සුදාරුණං තං
ධාවං තියොජනපථ **ඞ්ගුලිමාලවං තං**
ඉද්ධිභිසංඛතමනො ජිතවා මුනින්දො
තං තෙජසා භවතු මෙ ! ජයමංගලානි.

5. කත්වාන කට්ඨමුදරං ඉව ගබ්භිනීයා
**චිඤ්චාය** දුට්ඨවචනං ජනකායමජ්ඣෙ
සන්තෙන සොමවිධිනා ජිතවා මුනින්දො
තං තෙජසා භවතු මෙ ! ජයමංගලානි

6. සච්චං විහාය මති **සච්චක** වාදකෙතුං
වාදාභිරොපිතමනං අති අන්ධභූතං
පඤ්ඤාපදීපජලිතො ජිතවා මුනින්දො
තං තෙජසා භවතු මෙ ! ජයමංගලානි

7. **නන්දෝපනන්ද** භුජගං විබුධං මහිද්ධිං
පුත්තෙන ථෙරභුජගෙන දමාපයන්තො
ඉද්ධූපදෙසවිධිනා ජිතවා මුනින්දො
තං තෙජසා භවතු මෙ ! ජයමංගලානි

8. දුග්ගාහදිට්ඨි භුජගෙන සුදට්ඨහත්ථං
බ්‍රහ්මං විසුද්ධි ජුතිමිද්ධි **බකාභිධානං**
ඤාණාගදෙන විධිනා ජිතවා මුනින්දො
තං තෙජසා භවතු මෙ ! ජයමංගලානි

9. එතාපි **බුද්ධ ජයමංගල** අට්ඨගාථා
යො වාචකො දින දිනෙ සරතෙමතන්දි
හිත්වාන නෙකවිවිධානි චුපද්දවානි
මොක්ඛං සුඛං අධිගමෙය්‍ය නරො සපඤ්ඤො

(අනුන් සඳහා තෙ යනු යොදන්න.)

## ප්‍රස්තාවනාව

# බුදු පණ

යමක ජිවි ස්වරූපය - ක්‍රියාකාරිත්වය ප්‍රාණය - පණ යනුවෙන් හඳුන්වනු ලැබේ. ප්‍රාණය නැතිව ගිය කල්හි ජීවයක් නැත. ක්‍රියාකාරී බවක් නැත. ගසක පල දෙන්නේ එහි පණ ඇතිතාක් පමණි. මැරුණු ගසක පල හට ගන්නේ නැත. එයට වතුර පෝර හෙලීමෙන් වැඩක් නොවේ.

ආහාර විහරණ පැවතුම් වලින් අපේ ඇඟට පණක් ඇතිවන සැටි අපි දනිමු. ඒ අපේ ඇඟේ පණ තවත් ඇඟකට දිය නොහැක්කේය. සිතේ පණ තවත් අපරිමාණ සිත්වලට දිය හැක්කේය. බුදු පියාණන් වහන්සේ ලොවට දී වදාළේ බුදු ඇඟේ පණ නොව බුදු සිතේ පණය. ලොවට අමුතු එළියක් - විසිතුරක් පින් සිරිබර බුදු ඇඟෙන් ලැබුණු බව ඇත්තය. එහෙත් ලොව ඒකාන්තයෙන් නිවුනේ - සැනසුනේ බුදු ඇඟේ පණ දැක්මෙන් නොව බුදු සිතේ පණ දැක්මෙනි. මෙයට හොඳම නිදසුන වක්කලී පුවතය. අදත් අපට සැනසෙන්නට බුදු පණ තිබේ. ඒ අසිරිමත් බුදු ගුණ බුදු නුවණ හා බුදු වදන්ය. ලෝක ධාතුවේ මෙයට ඉහළින් සැනසිල්ලක් නැත. එදා මෙන් අදත් බුදු පණේ බල මහිමය අපට ප්‍රත්‍යක්‍ෂ කළ හැකිය.

පසුගියදා මා බලවත් අසනීපයකින් පීඩිතව සිටිද්දී අපේ අරියධම්ම ස්ථවිර නම ඇතුළු සසුන් දරු පිරිස පුරා මාසයක් තිස්සේ ඉතා කාරුණිකව දෙසූ අති විශේෂ පරිත්‍රාණ දේශනයනේ එනම් නව ගුණ, දස බල ඤාණ, චතුවෙසාරජ්ජ ඤාණ, චුද්දස බුද්ධ ඤාණ, පිරිතට නගා පැවැත්වූ පිරිත් දෙසුමෙන් මට ලැබුණු සැනසිල්ල වචනයෙන් පැහැදිලි කළ නොහැකිය. ඒ අනුත්තර බුද්ධ ඤාණ බලමහිමය සිතට දැනීගියේ ප්‍රාතිහාර්‍ය්‍ය තත්වයෙනි. මේ ශාන්ති පිරිත තවත් බොහෝ දෙනාගේ සැනසුම පිණිස පලකළොත් මැනවයි ඒ අවස්ථාවේ අදහසක් ඇතිවිය. ඒ ධර්ම ප්‍රාර්ථනාව දනවිකන්දේ බෝසත් ශාසන මව්පියන්ගෙන් සමෘද්ධවීම බලවත් සතුටකි.

පීතෝ භවතු ලොකොච - රාජා භවතු ධම්මිකො

මෙයට කාරුණික

**ක. ජිනවංස ස්ථවිර**

ගුණවර්ධන යෝගාශ්‍රමය
ගල්දුව - කහව.

# බුදු ගුණ පිරිතේ අනුසස්

බුද්ධ ගුණ ඒකාන්තයෙන්ම සත්‍යය. විද්‍යමානය මහානුභාව සම්පන්නය. කෙළ ලක්‍ෂයක් සක්වල ආඥා පැතිර පවත්නේය. බුදු ගුණ ඉක්මයාමට මුළු තුන් ලොව කිසිවෙකුත් නැත. බුද්ධ ගුණ සත්‍ය බවට බුද්ධ රත්නයම සාක්‍ෂිය අනන්ත බුද්ධ ගුණ ඇති තාක් සියල්ල එක්තැන් වූයේ ඉතිපිසො ගාථාවෙහිය.

බුදු ගුණ භාවනා වඩන්නාට ඇතිවන බුද්ධාලම්බන ප්‍රීතිය අප්‍රමාණය. බුද්ධ ගෞරවය. භක්තිය, විශ්වාසය අසීමිතය. මේ බුදු ගුණ පිරිත. පිරතක් සේම භාවනාවකි. මෙය අනුන්ට කීමේදීත් තමන්ම කියා ගැනීමේදීත් ඇතිවන ප්‍රීතිය හා ආනිශංස අති විශාලය. බුද්ධ ගෞරව පෙරටුව මෙය සජ්ඣායනා කිරීමේදී මහා කාරුණික බුදු පියාණන් වහන්සේ තමා ඉදිරියේ ජීවමානව වැඩ ඉන්නා සැටි සිතට දැනේ. නව අරහාදී බුදු ගුණ, දසබල ඥාණ, චතුර්වෛශාරද්‍ය ඥාණ හා චතුර්දශ බුද්ධ ඥාණ පිරිතට නංවා කිමේදී මෙනෙහි කිරීමේදී සෝමනස්ස සහගත ඥාණසම්පයුක්ත අසංඛාරික මහා කුශල් සිත් ඉතිරී පැතිරී යන සැටි පුදුමය.

සමවතට සමවන් කෙනෙකුට සේ පුන පුනා කුශල් උතුරායාමෙන් හා ඒකාන්ත විද්‍යාමාන බලගතු බුද්ධ ගුණ මතුකොට සත්‍ය ක්‍රියා ස්වරූපයෙන් සෙත් කිරීමේදී දේශක ශ්‍රාවක දෙපක්‍ෂයටම ඒ කෙණෙහිම අනුසස් ඇති වන්නේය.

සිල්වත්ව කරුණාධ්‍යාශයෙන් යුතුව අක්‍ෂර සම්පත්තිය ඇතිව මේ පිරිත දේශනා කිරීමෙන් හා සිල්වත්ව ශ්‍රද්ධාධ්‍යාශයෙන් යුතුව බුද්ධ ගෞරවයෙන් තැන්පත් එකඟ සිතින් ඇසීමෙන්ද ඒ මොහොතේම ගුණ ලැබෙන්නේය.

මේ බුදු ගුණ පිරිත යහපතැයි අනුමත කොට වදාළ අතිගරු ආචාර්‍යෝත්තම පූජ්‍ය පණ්ඩිත කඩවැද්දුව ශ්‍රී ජිනවංශ මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේට බුද්ධ ගුණානුභාව බලයෙන් ආයුරාරෝග්‍ය ශ්‍රී සම්පත් වර්ධනය වේවා.

මේ පිරිත භාවිතා කරන ඔබ අප සැමටම මහා බුදු ගුණ බලමහිම දැක දැක අමා මහා නිවන් අවබෝධ වීමට හේතු වාසනා වේවා.

මෙයට
සම්පාදක
**නාළයනේ අරියධම්ම ස්ථවිර**

ගුණවර්ධන යෝගාශ්‍රමය
ගල්දුව - කහව.

# බුදු ගුණ පිරිත

නමෝ තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

ඉතිපිසො - ස්වාක්ඛාතො - සුපටිපන්නො - මංගල සූත්‍රය
රතන සූත්‍රය - කරණීය මෙත්ත සූත්‍රය - අටවිසි පිරිත
(නිමවා අනනුරුව)

1. සො භගවා ඉතිපි අරහං - අරහං වත සො භගවා - තං භගවන්තං අරහංතං සරණං ගච්ජාමි - තංභගවන්තං අරහන්තං සිරසා නමාමි - තෙන අරහං ගුණ තෙජසා සොත්ථි තෙ හොතු සබ්බදා

2. සො භගවා ඉතිපි සම්මා සම්බුද්ධො - සම්මා සම්බුද්ධො වත සො භගවා තං භගවන්තං සම්මා සම්බුද්ධං සරණං ගච්ජාමි තං භගවන්තං සම්මා සම්බුද්ධං සිරසා නමාමි තෙන සම්මා සම්බුද්ධ ගුණ තෙජසා සොත්ථි තෙ හොතු සබ්බදා

3. සො භගවා ඉතිපි විජ්ජාචරණ සම්පන්නො - විජ්ජාචරණ සම්පන්නො වත සො භගවා - තං භගවන්තං විජ්ජාචරණ සම්පන්නං සරණං ගච්ජාමි - තං භගවන්තං විජ්ජාචරණ සම්පන්නං සිරසා නමාමි - තෙන විජ්ජාචරණ සම්පන්න ගුණ තෙජසා සොත්ථි තෙ හොතු සබ්බදා

4. සො භගවා ඉතිපි සුගතො - සුගතො වත සො භගවා තං භගවන්තං සුගතං සරණං ගච්ජාමි - තං භගවන්තං සුගතං සිරසා නමාමි - තෙන සුගත ගුණ තෙජසා සොත්ථි තෙ හොතු සබ්බදා

5. සො භගවා ඉතිපි - ලෝකවිදූ වත සො භගවා තං භගවන්තං ලෝකවිදූ සරණං ගච්ජාමි - තං භගවන්තං ලෝකවිදුං සිරසා නමාමි - තෙන ලෝකවිදූ ගුණ තෙජසා සොත්ථි තෙ හොතු සබ්බදා

6. සො භගවා ඉතිපි අනුත්තරො පුරිසදම්ම සාරථි - අනුත්තරෝ පුරිසදම්ම සාරථී වත සො භගවා - තං භගවන්තං අනුත්තරං පුරිසදම්ම සාරථිං සරණං ගච්ඡාමි - තං භගවන්තං අනුත්තරං පුරිසදම්ම සාරථිං සිරසා නමාමි -තෙන අනුත්තරපුරිසදම්ම සාරථි ගුණ තෙජසා - සොත්ථි තෙ හොතු සබ්බදා

7. සො භගවා ඉතිපි සත්ථා සත්ථා දේවමනුස්සානං - සත්ථා දේව මනුස්සානං වත සො භගවා - තං භගවන්තං සත්ථාරං දෙවමනුස්සානං සරණං ගච්ඡාමි - තං භගවන්තං සත්ථාරං දෙවමනුස්සානං සිරසා නමාමි - තෙන සත්ථාදෙව මනුස්සානං ගුණ තෙජසා සොත්ථි තෙ හොතු සබ්බදා

8. සො භගවා ඉතිපි බුද්ධො - බුද්ධො වත සො භගවා - තං භගවන්තං බුද්ධං සරණං ගච්ඡාමි - තං භගවන්තං බුද්ධං සිරසා නමාමි - තෙන බුද්ධ ගුණ තෙජසා සොත්ථි තෙ හොතු සබ්බදා

9. සො භගවා ඉතිපි භගවා - භගවා වත සො භගවා - තං භගවන්තං භගවන්ත සරණං ගච්ඡාමි - තං භගවන්තං භගවන්තං සිරසා නමාමි - තේන භගවා ගුණ තෙජසා සොත්ථි තෙ හොතු සබ්බදා

10. සො භගවා ඉතිපි දසබලධාරී - දසබලධාරි වත සො භගවා. තං භගවන්තං දසබල ධාරිං සරණං ගච්ඡාමි තං භගවන්තං දසබලධාරිං සිරසා නමාමි - තෙන දසබලඤාණ තෙජසා සොත්ථි තෙ හොතු සබ්බදා.

11. සො භගවා ඉතිපි චතුවෙසාරජ්ජ විසාරදො- චතුවෙසාරජ්ජ විසාරදො වත සො භගවා- තං භගවන්තං චතුවෙසාරජ්ජ විසාරදං සරණං ගච්ඡාමි - තං භගවන්තං චතුවෙසාරජ්ජ විසාරදං සිරසා නමාමි. තෙන චතුවෙසාරජ්ජ ඤාණ තෙජසා සොත්ථි තෙ හොතු සබ්බදා.

12. සො භගවා ඉතිපි දුක්ඛෙඤාණෙන සමන්නාගතො දුක්ඛෙඤාණෙන සමන්නාගතො වත සො තං භගවන්තං දුක්ඛෙඤාණෙන සමන්නාගතං සරණං ගච්ඡාමි - තං භගවන්තං දුක්ඛෙඤාණෙන සමන්නාගතං සිරසා නමාමි - තෙන දුක්ඛෙඤාණ තෙජසා - සොත්ථි තෙ හොතු සබ්බදා.

13. සො භගවා ඉතිපි සමුදයෙ ඤාණෙන සමන්නාගතො - සමුදයෙ ඤාණෙන සමන්නාගතො වත සො භගවා - තං භගවන්තං සමුදයෙඤාණෙන සමන්නාගතං සරණං ගච්ඡාමි - තං භගවන්තං සමුයෙඤාණෙන සමන්නාගතං සිරසා නමාමි තෙන නිරොධෙඤාණ තෙජසා සොත්ථි තෙ හොතු සබ්බදා.

14. සො භගවා ඉතිපි නිරොධෙඤාණෙන සමන්නාගතො නිරොධෙඤාණෙන සමන්නාගතො වත සො භගවා - තං භගවන්තං නිරොධෙඤාණෙන සමන්නා ගතං සරණං ගච්ඡාමි තං භගවන්තං නිරොධෙඤාණෙන සමන්නාගතං සිරසා නමාමි තෙන නිරොධෙඤාණ තෙජසා සොත්ථි තෙ හොතු සබ්බදා.

15. සො භගවා ඉතිපි මග්ගෙඤාණෙන සමන්නා ගතො. මග්ගෙඤාණෙන සමන්නාගතො වත සො භගවා. තං භගවන්තං මග්ගෙඤාණෙන සමන්නාගතං සරණං ගච්ඡාමි තං භගවන්තං මග්ගෙඤාණෙන සමන්නාගතං සිරසා නමාමි. තෙන මග්ගෙඤාණ තෙජසා - සොත්ථි තෙ හොතු සබ්බදා.

16. සො භගවා ඉතිපි අත්ථපටිසම්භිදෙඤාණෙන සමන්නා ගතො අත්ථිපටිසම්භිදෙඤාණෙන සමන්නාගතො වත සො භගවා තං භගවන්තං අත්ථපටිසම්භිදෙඤාණෙන සමන්නාගතං සරණං ගච්ඡාමි තං භගවන්තං අත්ථපටිසම්භිදෙඤාණෙන සමන්නාගතං සිරසා නමාමි - තෙන අත්ථපටිසම්භිදෙඤාණ තෙජසා සොත්ථි තෙ හොතු සබ්බදා.

17. සො භගවා ඉතිපි ධම්මපටිසම්භිදෙඤාණෙන සමන්නාගතො - ධම්මපටිසම්භිදෙඤාණෙන සමන්නාගතො වත සො භගවා - තං භගවන්තං ධම්මපටිසම්භිදෙඤාණෙන සමන්නාගතං සරණං ගච්ඡාමි - තං භගවන්තං ධම්මපටිසම්භිදෙඤාණෙන සමන්නාගතං සිරසා නමාමි - තෙන ධම්මපටිසම්භිදෙ ඤාණ තෙජසා සොත්ථි තෙ හොතු සබ්බදා.

18. සො භගවා ඉතිපි නිරුත්තිපටිසම්භිදෙඤාණෙන සමන්නාගතො නිරුත්තිපටිසම්භිදෙඤාණෙන සමන්නාගතො වත සො භගවා තං භගවන්තං නිරුත්තිපටිසම්භිදෙඤාණෙන සමන්නාගතං සරණං ගච්ඡාමි - තං භගවන්තං නිරුත්තිපටිසම්භිදෙ, ඤාණෙන සමන්නාගතං සිරසා නමාමි. තෙන නිරුත්තිපටිසම්භිදෙඤාණ තෙජසා සොත්ථි තෙ හොතු සබ්බදා.

19. සො භගවා ඉතිපි පටිභානපටිසම්භිදෙඤාණෙන සමන්නාගතො - පටිභානසම්භිදෙඤාණෙන සමන්නාගතො වත සො භගවා. තං භගවන්තං පටිභානපටිසම්භිදෙ ඤාණෙන සමන්නාගතං සරණං ගච්ඡාමි. තං භගවන්තං පටිභානපටිසම්භිදෙඤාණෙන සමන්නාගතං සිරසා නමාමි. තෙන පටිභානපටිසම්භිදෙ ඤාණ තෙජසා සොත්ථි තෙ හොතු සබ්බදා.

20. සො භගවා ඉතිපි ඉන්ද්‍රියපරොපරියන්තෙ ඤාණෙන සමන්නාගතො - ඉන්ද්‍රියපරොපරිත්තෙ ඤාණෙන සමන්නාගතො වත සො භගවා - තං භගවන්තං ඉන්ද්‍රියපරොපරියත්තෙඤාණෙන සමන්නාගතං සරණං ගච්ඡාමි - තං භගවන්තං ඉන්ද්‍රියපරොපරියන්තෙ ඤාණෙන සමන්නාගතං සිරසා නමාමි. තෙන ඉන්ද්‍රියපරෙපරියන්තෙ ඤාණ තෙජසා සොත්ථි තෙ හොතු සබ්බදා.

21. සො භගවා ඉතිපි ආසයානුසයෙ ඤාණෙන සමන්නාගතො ආසයානුසයෙ ඤාණෙන සමන්නාගතො වත සො භගවා - තං භගවන්තං ආසයානුසයෙ ඤාණෙන සමන්නාගතං සරණං ගච්ඡාමි - තං භගවන්තං ආසයානුසයෙ ඤාණෙන සමන්නාගතං සිරසා නමාමි - තෙන ආසායානුසයෙ ඤාණ තෙජසා සොත්ථි තෙ හොතු සබ්බදා.

22. සො භගවා ඉතිපි යමකපටිහාරියෙ ඤාණෙන සමන්නාගතො - යමකපටිහාරියෙ ඤාණෙන සමන්නාගතො වත සො භගවා - තං භගවන්තං යමකපටිහාරියෙ ඤාණෙන සමන්නාගතං සරණං ගච්ඡාමි - තං භගවන්තං යමකපටිහාරියෙ ඤාණෙන සමන්නාගතං සිරසා නමාමි - තෙන යමකපටිහාරියෙ ඤාණ තෙජසා සොත්ථි තෙ හොතු සබ්බදා.

23. සො භගවා ඉතිපි මහා - කරුණා සමාපත්තියා ඤාණෙන සමන්නාගතො - මහා කරුණා සමාපත්තියා ඤාණෙන සමන්නාගතො වත සො භගවා තං භගවන්තං මහා කරුණා සමාපත්තියා ඤාණෙන සමන්නාගතං සරණං ගච්ඡාමි - තං භගවන්තං මහා කරුණා සමාපත්තියා ඤාණෙන සමන්නාගතං සිරසා නමාමි - තෙන මහාකරුණා සමාපත්තියා ඤාණ තෙජසා සොත්ථි තෙ හොතු සබ්බදා.

24. සො භගවා ඉතිපි සබ්බඤ්ඤුතඤාණෙන සමන්නාගතො සබ්බඤ්ඤුතඤාණෙන සමන්නාගතො වත සො භගවා - තං භගවන්තං සබ්බඤ්ඤුත ඤාණෙන සමන්නාගතං සරණං ගච්ඡාමි - තං භගවන්තං සබ්බඤ්ඤුතඤාණෙන සමන්නාගතං සිරසා නමාමි. තෙන සබ්බඤ්ඤුතඤාණ සොත්ථි තෙ හොතු සබ්බදා.

25. සො භගවා ඉතිපි අනාවරණඤාණෙන සමන්නාගතො - අනාවරණ ඤාණෙන සමන්නාගතො වත සො භගවා - තං භගවන්තං අනාවරණඤාණෙන සමන්නාගතං සරණං ගච්ඡාමි තං භගවන්තං අනාවරණඤාණෙන සමන්නාගතං සිරසා නමාමි. තෙන අනාවරණ ඤාණ තෙජසා සොත්ථි තෙ හොතු සබ්බදා.

සබ්බීතියො - භවතු සබ්බමංගලං - නක්ඛත්තයක්ඛ භූතාන - යන්දුංනිමිත්තං - දුක්ඛප්පත්තාච - එත්තාවතාච - දානං දදන්තු - සබ්බේ බුද්ධා - දෙවො වස්සතු - ආකාසට්ඨාච

*සියලු සත්වයෝ නිදුක් වෙත්වා !*

# බෝධි වන්දනා ගාථා

1. සෙවිතං ධම්ම රාජේන - නරදේවේහි පූජිතං
වන්දාමි බෝධි රාජානං නිබ්බාන සුඛ දායකං

2. යස්සමූලෙ නිසින්නෝව - සබ්බාරි විජයං අකා
පත්තෝසබ්බඤ්ඤුතං සත්ථා - වන්දේතං බෝධි මුත්තමං

3. ඉන්ද්‍රනීල වණ්ණ පත්ත සේතබන්ධ භාසුරං
සත්ථුනෙත්ත පංකජාහි පූජිතග්ග සාතදං
අග්ග බෝධි නාමවාම දේවරුක්ඛ සන්නිභං
තං විසාල බෝධි පාදපං නමාමි සබ්බදා

4. යස්සමූලෙ මහා සත්තෝ - ජෙත්වාමාරං මහබ්බලං
පත්තෝ සබ්බඤ්ඤුතං සෙට්ඨං - වන්දේතං බෝධි පාදපං

5. යස්සමූලෙ නිසිදිත්වා - සත්තාහං ලෝක නායකො
විමුත්ති සුඛ සංවේදී - වන්දේතං බෝධි මුත්තමං

6. යස්ස පූජේසි සම්බුද්ධෝ - සත්තානං සකලෝචනෙ
පූජිතං නරදේවේහි - වන්දේතං බෝධි මුත්තමං

7. ආයුං ආරෝගතං වණ්ණං - යසංකිත්ති බලංධනං
සාධෙන්තං පූජයන්තානං - වන්දේතං බෝධි මුත්තමං

8. දුක්ඛං රෝගං භයංවේරං - සෝකං ජාතිං උපද්දවං
හරන්තං පූජයන්තානං - වන්දේතං බෝධි මුත්තමං

# ප්‍රාර්ථනා

1. පුඤ්ඤසෙදන නෙන මතිසිද්ධ මුදාවිතෙන
බුද්ධාදි වත්ථු ගත චිත්ත පසාදිතේන
ඤාණාදිරාම ගරු සංඝපති යතිනෙදා
සම්පාපුණාතු අමතංසුසමිද්ධ චිත්තො

2. පුඤ්ඤසෙදන නෙන මතිසිද්ධ මුදාවිතෙන
බුද්ධාදි වත්ථු ගත චිත්ත පසාදිතෙන
ථෙරාසභොථ ජිනවංස යතින්ද නාථො
සම්බෝධිඤාණ මධිගච්ඡතු සාධු සාධු

3. ධම්මෙන නෙන මතිසිද්ධ මුදාවිතෙන
බුද්ධාදි වත්ථු ගත ධම්ම බලෙන සද්ධිං
ථෙරාසභාථ ගරු ගාරව භාවනීයා
දීඝායුකා භවථ සාධු සමිද්ධ චිත්තා

ශ්‍රීමත් උත්තරීතර ගුණ ඇති බුද්ධාදී රත්නත්‍රයේ ගුණානුභාව බලයෙන් හා සෝමනස්ස සහගත ඥාණසම්ප්‍රයුක්ත අසංඛාරික වශයෙන් රැස්කර ගන්නාලද මේ උදාර කුශලානුභාව බලයෙන් අතිගරු ශ්‍රී ඥානාරාමාභිධාන මහෝපාධ්‍යාය මාහිමිපාණන් වහන්සේ සම්‍යක් ප්‍රාර්ථනා සඵල වී අමාමහ නිවනට පැමිණෙත්වා. ශ්‍රී කල්‍යාණී යෝගාශ්‍රම සංස්ථාවේ සම්පාදක අතිගරු කඩවැද්දුවේ ශ්‍රී ජිනවංස මාහිමිපාණන් වහන්සේ ද අනෙකුත් ගරු සම්භාවනීය සංඝපීතෘන්වහන්සේලා ද සකල සංකල්පනා සමෘද්ධ වී දීර්ඝායු ශ්‍රී සම්පත් ලබත්වා.

**සියළු සත්වයෝ ලොව සුවපත් වෙත්වා !!**

මුද්‍රණය :

සක්වා ප්‍රින්ටර්ස්
SAKVA PRINTERS
අංක 51/A, කුලරත්න පාර, අම්බලන්ගොඩ
Tel / Fax : 091-2258756